



ජාතික සමාජ සංවර්ධන ආයතනය

தேசிய சமூக அபிவிருத்தி நிறுவனம்

NATIONAL INSTITUE OF SOCIAL DEVELOPMENT

# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை

# ANNUAL REPORT 2023





කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

பெண்கள், சிறுவர் விவகார மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு

MINISTRY OF WOMEN, CHILD AFFAIRS AND SOCIAL EMPOWERMENT



# ජාතික සමාජ සංවර්ධන ආයතනය

## කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

### විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ උපාධි පිරිනමනු ලබන ආයතනයකි

# වාර්ෂික වාර්තාව - 2023

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 01. | වාර්ෂික වාර්තාව 2023 | |
| | 1.1 හැඳින්වීම | 1 - 2 |
| | 1.2 පාලක සභාව | 3 |
| | 1.3 අධ්‍යයන කටයුතු පිළිබඳ මණ්ඩලය | 3 - 4 |
| | 1.4 විගණන හා කළමනාකරණ කමිටුව | 4 - 5 |
| | 1.5 කාර්ය මණ්ඩලය | 5 - 7 |
| 02. | අංශයන්හි ප්‍රගතිය | |
| | 2.1 පරිපාලන හා මුදල් අංශය | 8 |
| | 2.2 සමාජ වැඩ විද්‍යාලය | 9 - 17 |
| | 2.3 පුහුණු අංශය | 18 - 42 |
| | 2.4 සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය | 43 - 51 |
| | 2.5 තත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය | 52 - 53 |
| 03. | අවසාන ගිණුම් - 2023 | 54 - 75 |
| 04. | විගණකාධිපති වාර්තාව | |
| | 4.1 විගණකාධිපති වාර්තාව | 76 |
| | 4.2 අවසාන ගිණුම් පිළිබඳ විගණන මතය | 77 - 82 |
| | 4.3 විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්ගේ නිරීක්ෂණයන් | 83 - 87 |

# ජාතික සමාජ සංවර්ධන ආයතනය

## දැක්ම

**සමාජ වැඩ අධ්‍යාපනයේ පුහුණු කටයුතුවල හා පර්යේෂණවල දේශීය හා ජාත්‍යන්තර ලෙස විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්වීම.**

## මෙහෙවර

**ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය සහ සමාජ සුභසාධනය සඳහා සියලුම මට්ටම්වලදී අවශ්‍ය සමාජ වැඩ පිළිබඳ කුසලතා පූර්ණ මිනිස් බල අවශ්‍යතා සපුරාගැනීම සමාජ වැඩ පිළිබඳ අවශ්‍ය දැනුම හා තාක්ෂණයන් යොදා ගනිමින් සමාජයට සුවිශේෂී සේවයක් සැපයීම.**

# සමාලෝචනය

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන ජාතික සමාජ සංවර්ධන ආයතනය ශ්‍රී ලංකාවේ සමාජ වැඩ අධ්‍යාපනය සපයන එකම උසස් අධ්‍යාපන ආයතනයයි. මෙම ආයතනය 1992 අංක 41දරණ පනත යටතේ උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ස්ථාපිත කර ඇත. මෙම ආයතනය 1978 අංක 16 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනතේ 25 A වගන්තිය යටතේ උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රදාන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇත. ඒ අනුව 2005 වර්ෂයේ දී උපාධි පිරිනැමීමේ බලය හා 2008 වර්ෂයේදී පශ්වාත් උපාධි පිරිනැමීමේ බලය ලබාදී ඇත. ආයතනය මගින් ක්‍රියාත්මක සියලුම පශ්වාත් උපාධි, උපාධි, උසස් ඩිප්ලෝමා, ඩිප්ලෝමා, සහතිකපත්‍ර පාඨමාලා සහ පුහුණු හා පර්යේෂණ වැඩසටහන් ජාතික අවශ්‍යතාවලට ගැලපෙන පරිදි අවශ්‍යතා තක්සේරු වාර්තා මත පදනම්ව සකස් කර ඇත. මෙම විෂයමාලා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (SLQF) නිර්දේශයන්ට අනුකූලව වෘත්තිකයන්, අධ්‍යාපනඥයින් සහ අභ්‍යන්තර කාර්ය මණ්ඩලය විසින් සකස් කර ඇත.

සමාජ වැඩ පිළිබඳ උපාධිය සහ ශාස්ත්‍රපති උපාධිය සමාජ සේවාවිද්‍යාලය පාසල විසින් පිරිනමනු ලබන ප්‍රධාන වැඩසටහන් වේ. ඊට අමතරව සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමාව සහ සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව පවත්වනු ලබයි. මෙම වැඩසටහන්වල විශේෂත්වය වන්නේ න්‍යායික දැනුම සමඟින් ප්‍රායෝගික ක්ෂේත්‍ර පුහුණුව මත පදනම් වූ කුසලතා වර්ධනය කිරීමයි. පුහුණු අංශය මගින් කෙටි කාලීන හා දිගුකාලීන පුහුණු වැඩසටහන් මෙන්ම අම්පාර, තලාව, රන්න, කිලිනොච්චිය, ප්‍රාදේශීය මධ්‍යස්ථාන පදනම් කර ගනිමින් සහතික පත්‍ර පාඨමාලා ද මන්නාරම, යාපනය, වවුනියාව, මඩකලපුව, කුරුණෑගල, පුත්තලම, රත්නපුර, දිස්ත්‍රික්කවල ද පවත්වනු ලැබේ. මෙම සහතිකපත්‍ර පාඨමාලා සහ කෙටි කාලීන පුහුණු වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කරනු ලබන්නේ දිවයින පුරා පිහිටි අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල ඉල්ලීම පරිදි සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීමේ අරමුණ පදනම් කරගෙන වේ. එසේම, උපදේශන ඩිප්ලෝමා පාඨමාලා කිහිපයක්, වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය ඩිප්ලෝමා පාඨමාලා සහ උපදේශන පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලා ගාස්තු අයකිරීමේ පාඨමාලාවක් ලෙස පවත්වනු ලැබේ. මෙම පාඨමාලා සීදුව ප්‍රධාන කාර්යාලයේ මෙන්ම ප්‍රාදේශීය මධ්‍යස්ථානවලද ඉහත සඳහන් දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගනිමින් පැවැත්වේ. එමෙන්ම උපදේශන පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර එය උපදේශන උපාධි පාඨමාලාවක් දක්වා සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සකස් කර ඇති අතර දැනට පවතින විෂය මාලාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත

සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය විසින් සමාජ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා විවිධ පර්යේෂණ දියත් කර ඇත. පර්යේෂණ පදනම් කර ගනිමින් අංශය විසින් සකස් කරන ලද පර්යේෂණ වාර්තා සහ පොත්පත් සමාජ සංවර්ධන හා සමාජ සුබසාධන ක්ෂේත්‍රවල දියුණුව සඳහා බෙහෙවින් භාවිත කළ හැකිය.

ආයතනයට අනුබද්ධ ප්‍රාදේශීය මධ්‍යස්ථාන හතරක් අනුරාධපුර (තලාව), අම්පාර, හම්බන්තොට (රන්න) සහ කිලිනොච්චිය යන ප්‍රදේශවල පිහිටුවා පවත්වාගෙන යනු ලැබේ. මෙම ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටුවීමේ මූලික පරමාර්ථය වන්නේ සීදුව මධ්‍යම කාර්යාලයේ දී පිරිනමන වැඩසටහන් ශ්‍රී ලංකාව පුරා විවිධ ප්‍රදේශවල වෙසෙන සිංහල, දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන් වෙත ව්‍යාප්ත කිරීමයි.

සීදූව ප්‍රදේශයේ අප ආයතනය සඳහා වර්ග අඩි 100,000ක ස්ථිර ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිවෙමින් පවතී. මෙමගින් ආයතනයේ අධ්‍යයන කටයුතු සඳහා බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව ප්‍රවර්ධනය කිරීමට අවස්ථාව සැලසෙන අතර රටේ පවතින අවශ්‍යතා අනුව නව පාඨමාලා ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට හැකි වේ. 2024 වර්ෂයේ මැද භාගය වන විට මෙම ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට ආයතනයේ පාලක සභාවේ අනුමැතිය ලැබී ඇත. එහි ප්‍රථම අදියර ලෙස න wing B ගොඩනැගිල්ල අවසන් වී ඇති අතර දැනට ආයතනයේ සියලුම අංශයන් එහි ස්ථාපිත කර ඇත. මෙම ගොඩනැගිල්ල wing A ගොඩනැගිල්ලේ ඉදිකිරීම 98.16% ක් අවසන්වී ඇත. මෙම ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් අවසන් වූ වහාම ප්‍රතිලාභීන් විශාල පිරිසකට ආයතනයේ පාඨමාලා හැදෑරීමට අවස්ථාව සැලසීමේ අරමුණින් පවතින ඉඩ ප්‍රමාණයේ නව පාඨමාලාව ආරම්භ කිරීමට නියමිතය.

ආයතනයේ සමාජ වැඩ උපාධි වැඩසටහන සාර්ථකව නිම කළ උපාධිධාරීන්ට රැකියා වෙළඳපොලේ විශාල ඉල්ලුමක් ඇති අතර ඔවුන් ඕස්ට්‍රේලියාව, කැනඩාව, එක්සත් ජනපදය සහ නවසීලන්තය වැනි රටවල සමාජ වැඩ වෘත්තිකයන් සහ පැරා වෘත්තිකයන් ලෙස රැකියාවන්හි නියුතුව සිටිති. මෙමගින් පුද්ගල සංවර්ධනයට පමණක් නොව රටේ විදේශ විනිමය ඉපැයීමට ද දායක වී ඇත.තවද අප ආයතනයේ උපාධිධාරීන් රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශ දෙකෙහිම රැකියා අවස්ථා ද ලබාගෙන ඇති අතර, ඔවුන්ගේ වෘත්තීය කුසලතා සමාජයේ අභිවෘද්ධිය සඳහා ප්‍රයෝජනයට ගෙන ඇත.

මේ වන විට ආයතනය විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් කිරීම සඳහා මූලික උත්සාහයන් ක්‍රියාත්මක වන අතර එහි මූලික පියවර ලෙස ආයතන පනත සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී. ඊට සමගාමීව, මෙම පීඨ හා දෙපාර්තමේන්තු පිහිටුවීම, නව උපාධි පාඨමාලා ආරම්භ කිරීම ඇතුළුව අධ්‍යයන පහසුකම් ස්ථාපිත කිරීමේ මූලික පදනම ආයතනය ලද ප්‍රගතියකි. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම නව උපාධි වැඩසටහන් හඳුන්වාදීම තුළින් සිසුන් විශාල පිරිසකට උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථා සැලකිය යුතු ලෙස පුළුල් වනු ඇත. අපගේ සියලුම අධ්‍යයන වැඩසටහන්වල විශිෂ්ටත්වය සහතික කිරීම සඳහා SCAQA විසින් අධීක්ෂණය කරන ලද තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලිය අපි සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. වසර 71 ක ඉතිහාසය හරහා තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ප්‍රශංසනීය දායකත්වයක් ලබා දී ඇති මෙම ආයතනය විශේෂයෙන් ශ්‍රී ලාංකීය ප්‍රජාවට සමාජ සත්කාර සැපයීම සඳහා කැපවී සිටී.

ආචාර්ය රවීන්ද්‍ර විතානාච්චි,
**අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.),**
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

# ජාතික සමාජ සංවර්ධන ආයතනය

## 01. වාර්ෂික වාර්තාව 2023

### 1.1 හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනය කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන උසස් අධ්‍යාපන ආයතනයකි. ජාතික සමාජ සංවර්ධන ආයතනය සමාජ සංවර්ධනය, සමාජ සුභසාධනය සහ සමාජ සවිබලගැන්වීමට අදාළ සමාජ වැඩ පිළිබඳ උපාධි, පශ්චාත් උපාධි සහ සමාජ ඩිප්ලෝමා මෙන්ම උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා පවත්වාගෙන යනු ලබයි. එය 1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධාන යටතේ ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකාවේ සමාජ වැඩ අධ්‍යාපනය සපයන එකම රාජ්‍ය ආයතනයද මෙම ආයතනය වේ. සමාජ වැඩ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වර්ෂ 2005 දී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය අනුව 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ ජාතික සමාජ සංවර්ධන ආයතනය උපාධි පිරිනමනු ලබන ආයතනයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හා සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය පිරිනැමීමේ බලය ලබා දී ඇත.

**දැක්ම**

සමාජ වැඩ අධ්‍යාපනයේ පුහුණු කටයුතුවල හා පර්යේෂණවල දේශීය හා ජාත්‍යන්තර ලෙස විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්වීම.

**මෙහෙවර**

ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය සහ සමාජ සුභසාධනය සඳහා සියලුම මට්ටම්වලදී අවශ්‍ය සමාජ වැඩ පිළිබඳ කුසලතා පූර්ණ මිනිස් බල අවශ්‍යතා සපුරාගැනීම සමාජ වැඩ පිළිබඳ අවශ්‍ය දැනුම හා තාක්ෂණයන් යොදා ගනිමින් සමාජයට සුවිශේෂී සේවයක් සැපයීම.

**අරමුණු**

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ සඳහන් කර ඇති පරිදි ආයතනයේ අරමුණු වනුයේ,

(අ) සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම්, වැඩසටහන් සහ වැඩ කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම.

(ආ) සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය පිළිබඳ උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම.

(ඇ) සමාජ සුභ සාධන ක්‍රම සහ සමාජ සංවර්ධන වැඩ සටහන් පිළිබඳව අධ්‍යයන කටයුතු පැවැත්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම.

(ඈ) සමාජ වැඩ වලදී තාක්ෂණය උපයෝගී කර ගැනීම ඇතුළුව සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපන ක්‍රමයෙහි නිර්මාණාත්මක පරිවයක් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ඉ) සමාජ සුභසාධන ක්‍රමයේ කාර්ය මණ්ඩලයේ වෘත්තීමය සහ කළමනාකාරීත්ව ප්‍රවීණතාව වර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.

(ඊ) සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය සම්බන්ධයෙන් විශේෂඥ සේවාවන් ආණ්ඩුවට සහ වෙනත් අනුමත සංවිධානයන්ට ලබා ගැනීමට සැලැස්වීම.

(උ) ඒ සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

**ඉහත කරුණු සාක්ෂාත් කරගැනිම සඳහා මෙම ආයතනය පහත සඳහන් කාර්යන්හි නිරත වේ.**

01. සමාජ වැඩ වෘත්තියවේදි අධ්‍යාපනය ලබා දීම.
02. සමාජ වැඩ පිළිබඳ දේශිය හා ජාත්‍යන්තර පුහුණු පාඨමාලා පැවැත්විම.
03. සමාජ වැඩ සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම හා ප්‍රකාශන පළ කිරිම.
04. සමාජ සුභසාධන ක්ෂේත්‍රයේ උපදේශන සේවා පැවැත්විම.
05. සමාජ සුභසාධන කටයුතු වල නියැලි සිටින රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල සේවකයින්ගේ කළමනාකරණ හා වෘත්තිය කුසලතා වැඩි දියුණු කිරිම.
06. සමාජ සුභසාධන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරිම පිළිබඳ ගරු ඇමතිතුමාට අවශ්‍ය සහය ලබා දිම.

**ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ක්‍රියාත්මක වැඩ සටහන් පහත සඳහන් පරිදිය.**

01. සමාජ වැඩපිළිබඳ ශාස්ත්‍රපති, සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා, සමාජ වැඩ ඩිප්ලෝමා,අතුරු වෘත්තිය පාඨමාලා හා වෙනත් පුහුණු පාඨමාලා සඳහා විෂයමාලා සංවර්ධනය, සංවිධානය කිරිම, පැවැත්විම සහ ක්ෂේත්‍ර වැඩ සම්බන්ධිකරණය
02. සමාජ සුභසාධන හා සමාජ ප්‍රතිපත්ති පිලිබඳ පර්යේෂණ දියුණු කිරිම, පැවැත්විම හා ක්‍රියාත්මක කිරිම
03. සමාජ වැඩ ප්‍රකාශන හා පත්‍රිකා එළි දැක්විම
04. සමාජ සුභසාධන කාර්යන්හි නියැලෙන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල නිලධාරින්ගේ වෘත්තිමය කළමනාකරණ සංවර්ධනය කිරිම සඳහා විදේශිය හා දේශිය ආයතන වල මූල්‍ය පහසුකම් ඇතිව සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්විම
05. ගරු ඇමතිතුමාට සමාජ සුභසාධන ප්‍රතිපත්ති සැලසුම් කිරිමට, ක්‍රියාත්මක කිරිමට, සහාය විම සඳහා එතුමාගේසාකච්ඡා හා කාර්ය මණ්ඩල රැස්විම් වලදි ප්‍රතිපත්තිමය තීරණ ගැනිමට සහය විම සහ ඒ සඳහා ලිඛිත යෝජනා ඉදිරිපත් කිරිම
06. රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශ වල සමාජ සුභසාධන සැලසුම් ක්‍රියාත්මක කිරිමේදි සමාජ වැඩ සිසුන් එම ආයතන වලට ඔවුන්ගේ ව්‍යාපෘති මගින් අනුයුක්ත කිරීම, ඔවුන්ගේ සංවර්ධන ක්‍රියාදාමයන්ට අවශ්‍ය මාර්ගෝපදේශයන් සැපයිම, ඔවුන්ගේ සේවාවන් වඩාත් අර්ථවත් පිණිස උපදේශන සේවා රැස්විම් හා සම්මන්ත්‍රණ පැවැත්වි

## 1.2 පාලක සභාව

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 7 (1) උප වගන්තිය ප්‍රකාරව 2023 වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතන පාලක සභාවේ සංයුතිය මෙසේය.

| | | | |
|---|---|---|---|
| 01 | යමුනා පෙරේරා මහත්මිය | - | ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය (සභාපති-නිල බලයෙන් ) 2023.01.01 දින සිට මේ දක්වා |
| 02 | ආචාර්ය රවීන්ද්‍ර විතානච්චි | | 2023.05.24 සිට මේ දක්වා |
| 03 | එම්.ටී.ආර්. ෂාමිණි අත්තනායක මහත්මිය | - | අධ්‍යක්ෂ ජනරාල් (රා.ආ.) 2018.07.09 – 2019.01.01 දක්වා- 2019.01.01 සිට 2023.05.23 දක්වා අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) |
| 04 | බී.කේ.ආර්. බාලසූරියා මහතා | - | සාමාජික 2022.03.02 සිට 2023.02.01 දක්වා |
| 05 | පී.ඒ. තිලකරත්න මහතා | | සාමාජික 2023.03.02 සිට මේ දක්වා |
| 06 | මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක | - | සාමාජික - 2020.02.28 දින සිට 2023.04.21 දක්වා |
| 07 | මහාචාර්ය ප්‍රේමකුමාරද සිල්වා | - | සාමාජික - 2020.07.08 දින සිට මේ දක්වා |
| 08 | මහාචාර්ය ආර්.එම්.කේ.රත්නායක | - | සාමාජික - 2020.07.08 දින සිට මේ දක්වා |
| 09 | ආචාර්ය ඉරේෂා දර්ශනී | - | සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා |
| 10 | ආචාර්ය ආර්.එම්.කේ. රත්නායක | - | සාමාජික - 2022.04.08 සිට 2023.04.01 දක්වා |
| 11 | ගෝඨාභය ජයරත්න මහතා | - | සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා |
| 12 | චන්දිමා වික්‍රමසිංහ මහත්මිය | - | සාමාජික - 2020. 02.28 දින සිට මේ දක්වා |
| 13 | ඩී. විදානගමආච්චි මහතා | - | සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා |
| 14 | සිසිර රත්නායක මහතා | - | සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා |
| 15 | රෝයි නිලන්ත සිල්වා මහතා | - | සාමාජික - 2020.02.28 දින සිට 2023.04.21 දක්වා |
| 16 | එස්.ඩී.එල්. සිල්වා මහත්මිය | - | සාමාජික - 2022.10.04 සිට මේ දක්වා |
| 17 | ඩබ්.ආර්.පී.යූ. නුවන්ති මෙනවිය | - | සාමාජික - 2023.02.20 දින සිට මේ දක්වා |
| 18 | මහාචාර්ය එච්.එම්.එස්.සී.බී.වයි. හීන්කෙන්ද | - | සාමාජික - 2023.04.21 සිට මේ දක්වා |
| 19 | ජොෂ්ඨ මහාචාර්ය එච්.ඩී.වයි.ඩී. ජයතිලක | - | සාමාජික - 2023.04.21 සිට මේ දක්වා |
| 20 | මහාචාර්ය ඊ.ඒ.ඩී.ඒ. එදිරිසිංහ | - | සාමාජික - 2023.04.21 සිට මේ දක්වා |

## 1.3 අධ්‍යයන කටයුතු පිළිබඳ මණ්ඩලය

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 10 (1) උප වගන්තිය ප්‍රකාරව පත් කරන ලද අධ්‍යයන කටයුතු මණ්ඩලය මෙසේය.

| | | | |
|---|---|---|---|
| 01 | යමුනා පෙරේරා මහත්මිය | - | ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය 2023.01.01 දින සිට මේ දක්වා |
| 02 | ආචාර්ය රවීන්ද්‍ර විතානච්චි මහතා | | 2023.05.24 සිට මේ දක්වා |
| 03 | එම්.ටී.ආර්. ෂාමිණි අත්තනායක මහත්මිය | - | අධ්‍යක්ෂ ජනරාල් (රා.ආ.) 2018.07.09 – 2019.01.01 දක්වා- 2019.01.01 සිට 2023.05.23 දක්වා අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) |

| | | | |
|---|---|---|---|
| 04 | මහාචාර්ය ඩබ්.එම්. ධනපාල මහතා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයන අංශය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 05 | ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න | - | අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය. |
| 06 | මහාචාර්ය උපාලි පන්නිලගේ | - | පීඨාධිපති - මානව ශාස්ත්‍ර පීඨය, රුහුණ විශ්ව විද්‍යාලය |
| 07 | මහාචාර්ය සුභාංගනී එම්.කේ. හේරත් | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - සමාජ විද්‍යා අංශය, කැළණිය විශ්ව විද්‍යාලය |
| 08 | ආචාර්ය ඒ.ඩබ්.කේ.ඩබ්. සුභසිංහ | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය - කැළණිය විශ්ව විද්‍යාලය |
| 09 | ආචාර්ය එස්.එම්.ඒ.කේ. සමරකෝන් | - | අංශාධිපති - වාණිජ හා කළමනාකරණ පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 10 | වී. වාසුදේවන් මහත්මිය | - | අධ්‍යක්ෂ (පුහුණු අංශය), ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 11 | කේ.එම්.වයි. කරුණාරත්න මහතා | - | අධ්‍යක්ෂ (සමාජ සේවා විද්‍යාලය), ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 12 | එම්.එස්.එම්. අස්මියාස් මහතා | - | අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන ප්‍රතිපත්ති පර්යේෂණ හා ප්‍රකාශන අංශය), ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 13 | සී.එච්.ඩී. හෙට්ටිආරච්චි මහත්මිය | - | ලේඛකාධිකාරි, ජාතික සමාජ සංවර්ධන ආයතනය |

## 1.4 විගණන හා කළමනාකරණ කමිටුව

| | | | |
|---|---|---|---|
| 01 | බී.කේ.ආර්.බාලසූරිය මහතා | - | ප්‍රධාන මූල්‍ය නිලධාරි (මුදල් අමාත්‍යාංශය) 2022.03.02 සිට 2023.02.01 දක්වා |
| 02 | පී.ඒ. තිලකරත්න මහතා | - | 2023.03.02 සිට මේ දක්වා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය |
| 03 | ඩී. විදානගමාච්චි මහතා | - | 2020.02.28 සිට මේ දක්වා විශ්‍රාමික නියෝජ්‍ය ලේකම් (මුදල් අමාත්‍යාංශය) |
| 04 | රෝයි නිලන්ත සිල්වා මහතා | - | 2020.02.28 සිට 2023.04.21 දක්වා කළමනාකරණ උපදේශක (කොලේජ් විලේජ් පෞද්ගලික සමාගම) |
| 05 | ඩී.එම්.ජී.පී. මල්කාන්ති මහත්මිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක (කාන්තා, ළමා කටයුතු සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය) |
| 06 | එම්.ආර්.පී. පීරිස් මහතා | - | විගණන අධිකාරිය (ජාතික විගණන කාර්යාලය) 2023.02.20 දිනැති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම දක්වා |
| 07 | එම්.ඒ.පී. මාරසිංහ මහත්මිය | - | විගණන අධිකාරිය (ජාතික විගණන කාර්යාලය) 2023.06.07 දිනැති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම දක්වා |
| 08 | එම්.ඩී.අයි. මලගල මහත්මිය | - | විගණන අධිකාරි (ජාතික විගණන කාර්යාලය) 2023.09.07 දිනැති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ සිට මේ දක්වා |

**ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සහභාගීත්වය**

| | | | |
|---|---|---|---|
| 01 | ආචාර්ය රවීන්ද්‍ර විතානච්චි | - | 2023.05.24 සිට මේ දක්වා |
| 02 | එම්.ටී.ආර්. ෂාමිණී අත්තනායක මහත්මිය | - | අධ්‍යක්ෂ ජනරාල් (රා.ආ.) 2018.07.09 – 2019.01.01 දක්වා-2019.01.01 සිට 2023.05.23 දක්වා අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) |
| 03 | එල්.කේ. පුෂ්පකාන්ති මහත්මිය | - | අධ්‍යක්ෂ (පාලන හා මුදල්) |
| 04 | යූ.ඩී.ඩී.ඩී. උස්හෙට්ටි මහත්මිය | - | අභ්‍යන්තර විගණක |
| 05 | ඊ.එච්. ලසිකා මධුවන්ති මහත්මිය | - | ගණකාධිකාරී |

## 1.5 කාර්ය මණ්ඩලය

### (අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය

2023 වර්ෂය තුල ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංයුතිය මෙසේය.

01. එම්.ටී.ආර්. ෂාමිණී අත්තනායක මහත්මිය - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන)2017.01.16 සිට

**සමාජ සේවා විද්‍යාලයේ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.**

| | | |
|---|---|---|
| 01. වර්ධරාජා ජෙයරුබන් මහතා | - | කථිකාචාර්ය II 2006.07.03 සිට 2012.07.02 දක්වා<br>කථිකාචාර්ය I 2012.07.03 සිට 2017.07.31 දක්වා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 2017.08.01 සිට මේ දක්වා |
| 02. ඊ.ඒ.එම්.එස්.ජී. විජේසේකර මහත්මිය | - | කථිකාචාර්ය II 2006.07.03 සිට 2012.07.06 දක්වා<br>කථිකාචාර්ය I 2012.07.07 සිට 2017.07.31 දක්වා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 2017.08.01 සිට මේ දක්වා |
| 03. ආචාර්ය යූ.එල්.එම්. අෂ්කර් මහතා | - | කථිකාචාර්ය II 2009.03.02 සිට 2015.03.01 දක්වා<br>කථිකාචාර්ය I 2015.0 3.02 සිට මේ දක්වා |
| 04. සී.එම්. මුණසිංහආරච්චි මහත්මිය | - | කථිකාචාර්ය II 2013.09.16 සිට 2023.09.14 දක්වා |
| 05. වී. බාලමති මහත්මිය | - | කථිකාචාර්ය II 2013.09.16 සිට මේ දක්වා |
| 06. එච්.එම්.ඩී.එස්. හේරත් මහත්මිය | - | කථිකාචාර්ය II 2014.05.02 සිට මේ දක්වා |
| 07. එල්.සී. ඉනෝකා ජයසේන මහත්මිය | - | කථිකාචාර්ය II 2015.12.01 සිට මේ දක්වා |
| 08. ඒ.එම්. මානාමුදලි මහත්මිය | - | කථිකාචාර්ය II 2018.08.01 සිට මේ දක්වා |
| 09. එම්.ටී. තර්ෂන් මහතා | - | කථිකාචාර්ය II 2023.04.17 සිට මේ දක්වා |
| 10. ඒ.එච්. ඉන්දික සංජීව මහතා | - | කථිකාචාර්ය II 2023.04.17 සිට මේ දක්වා |
| 11. කේ.පී.ආර්.එස්. අසංගිකා මෙනවිය | - | කථිකාචාර්ය II 2023.04.17 සිට මේ දක්වා |
| 12. ඩී.එම්.සී. ජනක බණ්ඩාර මහතා | - | කථිකාචාර්ය II 2023.04.17 සිට මේ දක්වා |
| 13. අයි.එම්.එම්. කුමාරි ඉහලගෙදර මෙනවිය | - | කථිකාචාර්ය II 2023.04.17 සිට මේ දක්වා |
| 14. ඩී.එම්.ඩබ්.කේ. චන්ද්‍රසිරි මහතා | - | පුස්තකාලයාධිපති 2015.06.01 සිට මේ දක්වා |

**පුහුණු අංශයේ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.**

01. වරදගෞරී වාසුදේවන් මහත්මිය - අධ්‍යක්ෂ (පුහුණු) 2015.05.05 සිට මේ දක්වා
02. දීප්ති නිරෝෂිකා මහත්මිය - පුහුණු නිලධාරි II 2007.03.01සිට 2013.02.28 දක්වා
පුහුණු නිලධාරි I 2013.03.01 සිට2018.07.31 දක්වා
ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරී 2018.08.01 සිට මේ දක්වා
03. කුමුදිනි වැදිසිංහ මහත්මිය - පුහුණු නිලධාරි II 2012.05.01 සිට 2019.09.30 දක්වා
ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරී 2019.10.01 සිට මේ දක්වා
04. බි.කේ.එස්. කරුණාරත්න මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
05. පී.සී. හෙට්ටිආරච්චි මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
06. ඒ.එම්.කේ.එල්. අධිකාරි මහත්මිය - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
07. ඒ.එච්. උබයදුල්ලා මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
08. ජේ.එච්.අයි. ප්‍රසාද් මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
09. ටී. තර්ෂන් මහතා - පුහුණු නිලධාරි II 2013.09.02 සිට 2023.04.16 දක්වා
10. වයි.එම්. නිම්සාත් මහතා - පුහුණු නිලධාරි II 2017.07.03 සිට මේ දක්වා
11. බී.ජී.අයි. මදුෂානි සමරසිංහ මහත්මිය - පුහුණු නිලධාරි II 2017.07.03 සිට 2023.09.04 දක්වා

**පර්යේෂණ අංශයේ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.**

01. එම්.එස්.එම්. අස්මියාස් මහතා - අධ්‍යක්ෂ (පර්යේෂණ) 2017.05.01 සිට මේ දක්වා
02. ජේ.කේ.පී.යූ. කිර්ති මහතා - පර්යේෂණ නිලධාරි I 2013.08.01 සිට 2018.07.31දක්වා
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී 2018.08.01 සිට මේ දක්වා
03. එස්. හරිහරතාමෝදරන් මහතා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී 2018.08.01 සිට මේ දක්වා
04. එච්.කේ.එස්.කේ. සිරිකුමාර මහත්මිය - පර්යේෂණ නිලධාරි II 2014.05.02 සිට මේ දක්වා
05. බි.ඒ. නිලූකා විජේබණ්ඩාර මහත්මිය - පර්යේෂණ නිලධාරී II 2017.01.16 සිට මේ දක්වා
06. ඒ.එච්. ඉන්දික සංජීව මහතා - පර්යේෂණ සහකාර III 2014.05.02 -2023.04.16 දක්වා
07. කේ.සී.කේ. ද තාබ්‍රෙව් මහත්මිය - පර්යේෂණ සහකාර III 2014.05.02 සිට මේ දක්වා
08. එස්.එච්.එන්. මධුෂානි සිල්වා මහත්මිය - පර්යේෂණ සහකාර III 2014.05.02 සිට මේ දක්වා

## (ආ) අනධ්‍යයන කාර්ය මණ්ඩලය

2023 වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පරිපාලන අංශයේ සංයුතිය පහත පරිදි වේ.

01. ආචාර්ය රවීන්ද්‍ර විතානච්චි - 2023.05.24 සිට මේ දක්වා
02. එම්.ටී.ආර්.ෂාමිණී අත්තනායක මහත්මිය - අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) 2019.01.01 සිට 2023.05.23 දක්වා
03. එල්.කේ. පුෂ්පකාන්ති මහත්මිය - අධ්‍යක්ෂ (පාලන හා මුදල්) 2017.03.01 සිට මේ දක්වා
04. සී.එච්.ඩී. හෙට්ටිආරච්චි මහත්මිය - ලේඛකාධිකාරි 2013.09.16 සිට මේ දක්වා
05. යූ.ඩී.ඩී.ධනුෂ්කා උස්හෙට්ටි මහත්මිය - අභ්‍යන්තර විගණක 2011.10.17 සිට මේ දක්වා
06. ඊ.එච්.ලසිකා මධුවන්ති මහත්මිය - ගණකාධිකාරී 2021.12.15 සිට මේ දක්වා

**පරිපාලන අංශයේ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.**

| තනතුර | අනුමත සේවක සංඛ්‍යා | ස්ථිර | ද්විතියන පදනම | අනියම් |
|---|---|---|---|---|
| 01. ගිණුම් නිලධාරී | 01 | - | - | - |
| 02. සහකාර ලේඛකාධිකාරී | 01 | - | - | - |
| 03. පරිගණක වැඩසටහන් සම්පාදක | 01 | 01 | - | - |
| 04. ව්‍යාපෘති වැඩසටහන් සම්පාදක | 01 | 01 | - | - |
| 05. කළමනාකරණ සහකාර | 34 | 31 | - | - |
| 06. නේවාසිකාගාර පාලිකා | 01 | 01 | - | - |
| 07. ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික | 01 | - | - | - |
| 08. ශ්‍රව්‍ය දෘශ්‍ය සහායක | 01 | 01 | - | - |
| 09. භාෂා පරිවර්තක | 02 | 01 | - | - |
| 10. රියදුරු | 09 | 08 | - | - |
| 11. කාර්යාල කාර්ය සහායක | 15 | 13 | - | - |
| 12. වැඩසටහන් සහකාර (ස්ථානභාර) | 04 | 03 | - | - |

# 2. 2023 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අංශයන්හි ප්‍රගතිය

## 2.1 පරිපාලන හා මුදල් අංශය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම් | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන පමාණය % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 134,000,000 | 115,680,000 | 114,021,571 | 98.57% |
| ප්‍රාග්ධන | 5,300,000 | 5,300,000 | 3,637,070 | 68.62% |
| සීදූව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම් | 190,000,000 | 190,000,000 | 35,889,000 | 19% |
| සීදූව ගොඩනැගිල්ල සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 40,000,000 | 40,000,000 | 39,872,674.78 | 99.7% |

සීදූව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් හා ගොඩනැගින්ලේ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන අමාත්‍යංශයේ වැය ශිර්ෂය වෙත වෙන්කරනු ලබයි. Wing A හා Wing B ලෙස නම් කරන ගොඩනැගිලි සංකීර්ණයේ Wing B ගොඩනැගින්ලේ ඉදිකිරීම් අවසන් කර ඇති අතර Wing A ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 98.16% අවසන් කර ඇත.

### Wing A ගොඩනැගිල්ල

**ඉදිරිපස පෙනුම**





### Wing B ගොඩනැගිල්ල





## 2.2 සමාජ සේවා විද්‍යාලය

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් පවත්වනු ලබන සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලා සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා**

<table>
<tr><th rowspan="2">අනු: අංකය</th><th rowspan="2">පාඨමාලා නම, මාධ්‍ය සහ ස්ථානය</th><th rowspan="2">ආරම්භ වූ දිනය</th><th rowspan="2">සහභාගී වන සිසුන් සංඛ්‍යාව</th><th rowspan="2">පාඨමාලාවේ ප්‍රගතිය</th><th colspan="2">ජනවාරි සිට දෙසැම්බර් දක්වා මූල්‍ය ප්‍රගතිය</th></tr>
<tr><th>මුදල් වෙන් කිරීම (රුපියල් මිලියන)</th><th>වියදම් (රුපියල් මිලියන)</th></tr>
<tr><td>1</td><td>සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය 2017 – 2018- ඉංග්‍රීසි මාධ්‍යය</td><td>17.07.2017</td><td>30</td><td>උපාධි ප්‍රදානෝත්සවය සාර්ථකව පවත්වන ලදී.</td><td rowspan="6">8.50</td><td rowspan="6">8.50</td></tr>
<tr><td>2</td><td>සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය 2018 – 2019- ඉංග්‍රීසි මාධ්‍යය</td><td>19.06.2018</td><td>42</td><td>4 වන වසර 2 වන අධ්‍යයන වාරය - ප්‍රජාව සමඟ වැඩ කිරීමේ අඛණ්ඩ ක්ෂේත්‍ර පුහුණුව</td></tr>
<tr><td>3</td><td>සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය 2019/2020 සිංහල ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍ය</td><td>24.02.2020</td><td>සිංහල -30<br>දෙමළ -24<br>ඉංග්‍රීසි -20<br>මුළු -74</td><td>4 වන වසර 1 වන සමාසික පන්තිකාමර ඉගැන්වීම සිදු වෙමින් පවතී</td></tr>
<tr><td>4</td><td>සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය 2020/2021 සිංහල ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍ය</td><td>21.04.2021</td><td>සිංහල -83<br>දෙමළ -67<br>ඉංග්‍රීසි -23<br>මුළු -157</td><td>3 වන වසර 1 වන සමාසික පන්තිකාමර ඉගැන්වීම සිදු වෙමින් පවතී</td></tr>
<tr><td>5</td><td>සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය 2021/2022 සිංහල ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍ය</td><td>20.04.2022</td><td>සිංහල - 174<br>දෙමළ -168<br>ඉංග්‍රීසි - 69<br>මුළු - 411</td><td>2 වන වසර 1 වන සමාසික පන්තිකාමර ඉගැන්වීම සිදු වෙමින් පවතී</td></tr>
<tr><td>6</td><td>ශිෂ්‍යාධාර<br>සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (2018 /2019, 2019/2020, 2020/2021, 2021/2022)</td><td>2023 ජනවාරි සිට 2023 දෙසැම්බර් දක්වා</td><td>258</td><td>1 වසරේ සිට 4 වසර දක්වා</td></tr>
</table>

**වැඩසටහන: සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (MSW) සහ සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව (SWD)**

**කාලය: 2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා**

| අනු: අංකය | පාඨමාලා නම | සිසුන් සංඛ්‍යාව | වත්මන් තත්ත්වය | මූල්‍ය ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | මුළු ආදායම (රුපියල් මිලියන) | මුළු වියදම ( රුපියල් මිලියන) | ශේෂය ( රුපියල් මිලියන) |
| 1 | සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 2019/2020 | 8 | උපාධි ප්‍රදානෝත්සවය | 15.35 | 11.30 | 4.05 |
| 2 | සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 2020/2021 | 57 | උසස් ක්ෂේත්‍ර පුහුණුව සිදුවෙමින් පවතී | | | |
| 3 | සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 2021/2022 | 83 | පදනම් ක්ෂේත්‍ර පුහුණුව සිදුවෙමින් පවතී ( ආරම්භක දිනය 13.10.2023) | | | |

## සමාජ සේවා විද්‍යාලය

සමාජ සේවා විද්‍යාලය (SSW) යනු ජාතික සමාජ සංවර්ධන ආයතනයේ විශාලතම සහ පැරණිතම අංශයයි. 1952 දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන ආරම්භ කිරීමත් සමඟ වෘත්තීය සමාජ වැඩ අධ්‍යාපනය ආරම්භ කරන ලදී. එය 1964 දී (Ceylon School of Social Work) ලංකා සමාජ සේවා විද්‍යාලය ලෙසත්, 1972 දී ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය ලෙසත්, රජයේ ආයතනයක් ලෙස ක්‍රියාත්මක විය. සමාජ සේවා විද්‍යාලය මගින් සමාජ වැඩ පිළිබඳ වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් පවත්වන අතර, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත උපාධි පිරිනමනු ලබයි. ආරම්භයේ දී ආයතනය මගින් කෙටි කාලීන පුහුණු වැඩසටහන් පමණක් පවත්වන ලද අතර වර්තමානය වන විට අධ්‍යයන වැඩසටහන් රාශියක් පවත්වනු ලබයි. එනම් 1978 සිට මේ දක්වා සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව (SWD), 2013 සිට දෙවසරක සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා (HDSW) වැඩසටහන, 2005 සිට සමාජ වැඩ උපාධිය සහ ශාස්ත්‍රපති උපාධිය පවත්වනු ලබයි. 2008 සිට සමාජ වැඩ සහ කෙටි කාලීන සහ අර්ධ-කාලීන වැඩසටහන් කිහිපයක් ආරම්භ කරන ලදී. 2005 ජුනි 01 වැනි දින අංක 1395/15 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ නියෝගයෙන් සමාජ වැඩ පිළිබඳ උපාධිය සහ 2008 ජූලි 07 දිනැති 1557/7ගැසට් පත්‍රයේ නියෝගය අනුව සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිරිනැමීමට බලය ලබා දී ඇත.



මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අරමුණු සහ පරමාරථ පහත පරිදි වේ.

1. සමාජ වැඩ අධ්‍යාපනය සඳහා නව වැඩසටහන් හඳුන්වා දීම.

2. පවතින අධ්‍යාපනික වැඩසටහන් වැඩිදියුණු කිරීම.

3. සමාජ වැඩ අධ්‍යාපනය තුළ තොරතුරු තාක්ෂණ සහ ඉංග්‍රීසි භාවිතය වැඩිදියුණු කිරීම.

4. වෘත්තීය පිළිගැනීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

5. සමාජ සංවර්ධනය සහ සමාජ සවිබල ගැන්වීම සඳහා සමාජ වැඩ වෘත්තිකයන් බිහි කිරීම.

**සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MSW)**



සමාජ සේවා අමාත්‍යාංශය සහ කැනඩාවේ කිංග්ස්ටන් හි ක්වීන්ස් විශ්ව විද්‍යාලය විසින් ක්‍රියාත්මක කරන ලද කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනයේ (CIDA) අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට පවත්වනු ලබන සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ පළමු කණ්ඩායම ආරම්භ විය.

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ අරමුණු වනුයේ වෘත්තීමය සුදුසුකම් සහ කළමනාකාරීත්වය දක්ෂතාවයක් සහිත මිනිස් බලපුහුණු ශ්‍රමය සමාජ සුභසාධන පද්ධතිය සඳහා නිපදවීමත් ඒ තුළින් සමාජ සංවර්ධනය දිරිගැන්වීමත්ය. මෙම වැඩසටහන නිර්මාණය කොට ඇත්තේ සමාජ වැඩ පිළිබඳ උසස් දැනුමත්, ප්‍රායෝගික පුහුණුවීම් ආදිය මූලික කරගෙන සහභාගිවන්නන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම තුළින් ඔවුන් සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ නියමුවන් ලෙස ප්‍රතිපත්ති සැළසුම් කිරීමේදි ඔවුන්ගේ සක්‍රීය දායකත්වය ලබාගැනීම සඳහාය.

## සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි (MSW) පාඨමාලාවේ අරමුණු

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ ප්‍රධාන පරමාර්ථය වන්නේ දැනටමත් සමාජ සේවයේ නියැලී සිටින උපාධිධාරීන්ගේ / අනෙකුත් සමාන සුදුසුකම් ලත් පුද්ගලයින්ගේ නිපුණතා ඉහළ නැංවීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඉල්ලුම සපුරාලීම සඳහා වෙනත් විෂයයන්ගෙන් උපාධිධාරීන්ට සහ අනෙකුත් සමාන සුදුසුකම් ලත් පුද්ගලයින්ට අවස්ථා ලබා දීමයි. කළමනාකරණ මට්ටමින් රටේ වෘත්තීය සමාජ සේවකයින්ගේ හදිසි අවශ්‍යතාවය සපුරාලීම සඳහා සමාජ වැඩ පිළිබඳ උසස් දැනුමක් ලබා ගැනීමය.

### පාඨමාලාවේ විෂය අන්තර්ගතය

ශාස්ත්‍රපති පාඨමාලාවේ විෂය අන්තර්ගතය සැකසීමේදී සමාජීය විද්‍යාවන් මෙන්ම සමාජ වැඩ විෂයට අදාළ ක්‍රමෝපායන්ගෙන් යුක්ත විෂය නිර්දේශයක් සකසා ඇත. මෙහිදි විශේෂයෙන්ම න්‍යායාත්මක දැනුම මෙන්ම ප්‍රායෝගික දැනුම ලබාගැනීම සඳහා ක්ෂේත්‍ර පුහුණුවීම් දෙකක්ද පර්යේෂණාත්මක නිබන්ධනයක් ද සකස් කිරීමත් සිසුන් විසින් සිදුකළ යුතුය. ඒ අනුව සමාජ වැඩ සඳහා සමාජ විද්‍යාව, සමාජ වැඩ සඳහා මනෝ විද්‍යාව, සමාජ වැඩ දර්ශනය සහ මූලිකාංග, ශ්‍රී ලංකා සමාජය අවබෝධ කරගැනිම, ශ්‍රී ලංකාවේ සමාජ සුභසාධන වැඩසටහන් ගෝලීයකරණය හා සමාජ සුභසාධනය, සමාජ වැඩ සහ මානව අයිතිවාසිකම්, සමාජ වැඩ කළමනාකරණය, සමාජ වැඩ ප්‍රතිපත්ති, සමාජ වැඩ සඳහා පර්යේෂණ ක්‍රමවේද යන විෂයන්ගෙන් මෙන්ම මූලික ක්ෂේත්‍ර පුහුණුවීම් ප්‍රජාව හා කණ්ඩායම් සමඟ වැඩ කිරීමේ ක්ෂේත්‍ර පුහුණුවීම් සහ පර්යේෂණාත්මක නිබන්ධනය සිදුකිරීමෙන් ප්‍රායෝගික දැනුම, කුසලතා ලබාගැනීමට සිසුන්ට අවස්ථාව සපයා ඇත.

මෙම පාඨමාලා Sri Lanka Qualification Frame work (SLQF) අනුව සකස් කර ඇති අතර, ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතියකින් යුක්තව ලකුණු ලබාදිම සිදුකරනු ලබයි. එබැවින් අප ආයතනයේ සමාජ වැඩ ශාස්ත්‍රපති උපාධිය හදාරනු ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විදේශීය රැකියා ලබාගැනීමට ඇති හැකියාව ඉහළ මට්ටමක පවතී.

## සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධිය



### හැඳින්වීම

සමාජ වැඩ පිළිබඳ උපාධිය වසර 4 ක පූර්ණකාලීන පාඨමාලාවකි. එය සමාසික 08 කින් සමන්විත අතර, පංති කාමර දේශන හා සමගාමී ක්ෂේත්‍ර පුහුණුවීම් තුනකින් යුක්ත වේ. විශේෂයෙන්ම සමාජ වැඩ ශාස්ත්‍ර වේදී උපාධිය ශ්‍රී ලංකාවේ ඇති අනෙකුත් විශ්වවිද්‍යාලවලින් පවත්වනු ලබන උපාධි පාඨමාලාවලට වඩා සුවිශේෂී වන්නේ න්‍යායාත්මක දැනුම පමණක් නොව ප්‍රායෝගික පුහුණුවීම්වලින් ද යුක්ත වන නිසයි. එසේ වන්නේ පංති කාමර දේශන අතරතුරදීම ශිෂ්‍යයින්ගේ දැනුම, ආකල්ප වෙනස් කිරීම සඳහා ක්ෂේත්‍ර ගත පුහුණුවීම්වලට ශිෂ්‍යයින් අනුයුක්ත කරන අතර, ක්ෂේත්‍ර අධීක්ෂකවරුන්ගේ සහ පීඨ අධීක්ෂකවරුන්ගේ මගපෙන්වීම, උපදෙස් මත ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් දියත් කරනු ලබයි.

මෙම ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය සමාජීය විද්‍යාවන්ගේ විෂය අන්තර්ගතයන් මෙන්ම සමාජ වැඩවලට පමණක් සුවිශේෂී වූ ක්‍රමෝපායන්වලින් යුක්ත වන අතර, සිසුන්ට ඒ පිළිබඳ පුළුල් දැනුමක් ලබා දෙනු ලබයි. එමෙන්ම ක්ෂේත්‍ර පුහුණුවීම් මගින් ප්‍රජා ක්‍රියාකාරකම් සිසුන් විසින් කළ යුතු අතර, එම ක්‍රියාකාරකම් අලලා වාර්තා සකස් කිරීම අනිවාර්යය වේ. මීට අමතරව සිසුන් විසින් පර්යේෂණයක් සිදුකර එහි සඳහන් වන නිගමනයන්ට අනුව ක්‍රියාකාරකම් සැළසුම් කර දියත් කළ යුතු අතර, පර්යේෂණ වාර්තාවක් ද එමගින් සකස් කළ යුතුය.

මෙම උපාධි පාඨමාලාවේ සුවිශේෂත්වය වන්නේ න්‍යායාත්මක දැනුම ලබා දෙනු ලබන පැය ගණනට වඩා වැඩි පැය ගණනක් ක්ෂේත්‍ර පුහුණුවීම් සඳහා යොදවා ඇති බැවිනි. පාඨමාලාව සඳහා බඳවාගැනීමේ සුදුසුකම් පහත පරිදි දැක්විය හැකි අතර, එම සුදුසුකම්ලත් අයදුම්කරුවන් ආයතනය විසින් පවත්වනු ලබන ඇතුළත්වීමේ විභාගයකට පෙනී සිට එයින් සමත්වන සිසුන් සම්මුඛ පරීක්ෂණයක් ඉදිරියේ පෙනී සිටිය යුතු අතර, එයින් වැඩිම ලකුණු ලබාගන්නා සිසුන් උපාධි පාඨමාලාවට ඇතුළත් කරගනු ලබයි.

සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධිය 2013 වර්ෂයේ සිට සිංහල, ඉංග්‍රීසි, දමිළ යන භාෂා මාධ්‍යය තුනෙන්ම පවත්වනු ලබන අතර, පළමු සහ දෙවන වසර සිසුන්ට ඔවුන්ගේ මවු භාෂාවෙන් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යයන කටයුතු ආරම්භ කළ හැකිය. පළමු හා දෙවන වසර සිංහල හා දෙමළ භාෂාවෙන් හදාරන සිසුන් දෙවන වසර අවසානයේදී ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ විභාගයක් සහ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු අතර, එයින් සමත්වන සිසුන් තෙවන වසර සිට ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය හැදෑරීම සඳහා සුදුසුකම් ලබයි.

**උපාධිධාරීන් සඳහා රැකියා අවස්ථා**

**රාජ්‍ය අංශයේ රැකියා**

- සමාජ වැඩ කථිකාචාර්ය - වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- සමාජ වැඩ උපදේශක - වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- රේගු නිලධාරීන්
- සංවර්ධන සහකාර
- පරිවාස නිලධාරීන්
- ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්
- ජාතික ළමා ආරක්ෂක නිලධාරීන්
- කාන්තා සංවර්ධන නිලධාරිනියන්
- උපදේශකයින්
- ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපන සේවය
- මනෝචිකිත්සක සමාජ වැඩ උපදේශක

රාජ්‍ය නොවන අංශය - සමාජ වැඩ වෘත්තිකයන්ට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විශාල ඉල්ලුමක් පවතී. ඒ අනුව අප ආයතනයේ උපාධිධාරීන් සඳහා පහත රැකියා අවස්ථා තිබේ.

- ව්‍යාපෘති කළමනාකරු / නිලධාරීන් / සම්බන්ධීකාරක
- වැඩසටහන් නිලධාරීන්
- උපදේශක / වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරි
- අධීක්ෂණ සහ ඇගයීම් නිලධාරීන්
- ක්ෂේත්‍ර නිලධාරීන්

**පුද්ගලික අංශය - සමාජ වගකීම් සම්බන්ධීකාරක**

- උපදේශක
- මානව සම්පත් කළමනාකරු/ නිලධාරීන්

**විෂය බාහිර ක්‍රියාකාරකම්**

**2023 මාර්තු 19 වන දින සමාජ වැඩ දිනය "ඒකාබද්ධ සමාජ ක්‍රියාකාරකම් හරහා විවිධත්වයට ගරු කිරීම"**




ලෝක සමාජ වැඩ දිනය සෑම වසරකම මාර්තු මාසයේ තුන්වන අඟහරුවාදා සමරනු ලැබේ. මෙම දිනය සමාජ වැඩවල ජයග්‍රහණ ඉස්මතු කිරීම, සමාජයන්හි අනාගතය සඳහා සමාජ සේවාවල දෘශ්‍යතාව ඉහළ නැංවීම, සමාජ සාධාරණත්වය සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ සමාජ වැඩකරුවන්ගේ කාර්ය භාරය ඉටු කිරීමේ හැකියාව සහ කඩිසරකම හඳුනා ගැනීම අරමුණු කරගත් සැමරුම් දිනයකි. මෙම දිනයේ, සමාජ සේවා සංවිධාන සමාජ සාධාරණත්වය, මානව හිමිකම් සහ සමාජ සංවර්ධනය වෙනුවෙන් පෙනී සිටින අතරම සමාජ වැඩවල උසස්ම භාවිතයන් ප්‍රවර්ධනය කරයි. සමාජ වැඩකරුවන් තම සේවාදායකයාගේ සහ ප්‍රජාවගේ අවශ්‍යතා සහ අභියෝග තක්සේරු කිරීමට ප්‍රජාව තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි, ඔවුන්ගේ ජීවිත වැඩිදියුණු කිරීමට අවශ්‍ය සම්පත් වෙත ප්‍රවේශ වීමට සහ අභ්‍යන්තර හා බාහිර සම්පත් තමන් විසින්ම භාවිතා කිරීමෙන් ඔවුන්ගේ අභියෝග ජය ගැනීමට මිනිසුන් දැනුවත් කරයි. සමාජ සේවකයින්ගේ ජාත්‍යන්තර සම්මේලනය (IFSW) 2007 දී පළමු ලෝක සමාජ වැඩ දිනය සමරනු ලැබුවේ "සමාජ වැඩ -වෙනස් ලෝකයක් ඇති කිරීම" යන තේමාව යටතේ ය. IFSW යනු සමාජ වැඩ වෘත්තිය සඳහා වන ගෝලීය ආයතනය වන අතර එහි සාමාජිකයින් ඇතුළත් කර ගැනීම, සමාජ සාධාරණත්වය සහ මානව හිමිකම් සඳහා කටයුතු කිරීම සිදුකරයි. ඔවුන් ජාත්‍යන්තර සහයෝගීතාවයේ සහාය ඇතිව ලොව පුරා සමාජ වැඩවල හොඳම භාවිතයන් ප්‍රවර්ධනය කිරීමට ද කටයුතු කරයි.





2023 ලෝක සමාජ වැඩ දිනයේ තේමාව වන්නේ ඒකාබද්ධ සමාජ ක්‍රියාකාරකම් හරහා විවිධත්වයට ගරු කිරීමයි. ලෝක සමාජ වැඩ දිනය සෑම වසරකම මාර්තු මස තුන්වන අඟහරුවාදා දින පවත්වනු ලබන අතර 2023 වර්ෂයේ මාර්තු 21 අඟහරුවාදා දිනට යෙදී ඇත. 2023 ලෝක සමාජ වැඩ දිනයේ ප්‍රධාන අරමුණ වන්නේ "ඒකාබද්ධ සමාජ ක්‍රියාකාරකම් හරහා විවිධත්වයට ගරු කිරීම" වේ. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ සේවා විද්‍යාලය, සමාජ වැඩ සඳහා වන ශ්‍රී ලංකා වෘත්තීයවේදී සංගමය සහ අනෙකුත් ජාතික සහ ප්‍රාදේශීය රාජ්‍ය නොවන ආයතන එක්ව සෑම වසරකම ලෝක සමාජ වැඩ දිනය සමරන අතර එය 2023 මාර්තු 29 වන දින ශ්‍රී ලංකාවේ සමරනු ලැබීය. ලෝක සමාජ වැඩ දිනයේ ගෝලීය තේමාව නියෝජනය කරන වැඩසටහන් කිහිපයක් සංවිධානය කිරීම සඳහා උපාධි අපේක්ෂකයින් , පශ්චාත් උපාධි අපේක්ෂකයින් සහ සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති සිසුන් ඔවුන්ගේ අව්‍යාජ උත්සාහය දරනු ලබයි.

**මානව ජනාවාසවල සේවා සැපයීම පිළිබඳ වැඩසටහන 2023**




සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියේ 2019/2020 තෙවන වසරේ සිසුන් විසින් පවත්වනු ලබන ග්‍රාමීය කඳවුර නුවරඑළිය දිස්ත්‍රික්කයේ තලවකැලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජූලි 27 සිට අගෝස්තු 08 දක්වා සංවිධානය කරන ලදී. තලවාකැලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ගම්මාන ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. සිසුන් දින 10 ක් ක්ෂේත්‍රයේ නේවාසිකව සිටි අතර එහිදී ප්‍රදේශයේ ජනතාව මුහුණ දෙන ගැටලු හඳුනා ගන්නා ලදී. විශේෂයෙන්ම එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවා සැපයීමේ දුර්වලතා, සේවා පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම නිලධාරීන්ගේ අවබෝධයේ ඌනතාවය පිළිබඳවද මෙම මැදිහත්වීමේදී අවධාරණය කෙරිණි.








මානව වාසභූමි වල සේවා සැපයීමේ වැඩසටහන සාර්ථකව නිමකිරීම සඳහා සිසුන් හා අධ්‍යයන කාර්යමණ්ඩලය වෙත තලවකැලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නුවර එළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ තලවකැලේ වර්ල්ඩ් විෂන් (World Vision) යන ආයතන විශාල අනුග්‍රහයක් ලබාදෙන ලදී.

## 2.3 පුහුණු අංශය



(වාර්ෂික ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය - 2023)

**හැඳින්වීම**

2004 වර්ෂයේදී ස්ථාපනය කරනු ලැබූ පුහුණු අංශය, ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ආයතනික ව්‍යුහයේ ප්‍රධාන අංශ හතර අතුරින් එකක් වශයෙන් හැඳින්විය හැකිය. මෙම අංශය අධ්‍යක්ෂක (පුහුණු) යටතේ ක්‍රියාත්මක වේ. ජ්‍යෙෂ්ඨ පුහුණු කිරීමේ නිළධාරිනියන් දෙදෙනෙකු සහ දෙවන ශ්‍රේණියේ පුහුණු කිරීමේ නිළධාරීන් / නිළධාරිනියන් 08 දෙනෙකු මෙම අංශය තුළ සේවය කරනු ලබයි. මීට අමතරව කළමණාකාර සහකාර I එක් නිළධාරිනියක්, කළමණාකාර සහකාර II නිළධාරිනියන් දෙදෙනෙකු, කළමණාකාර සහකාර III එක් නිළධාරියෙකු සහ කාර්යාල කාර්ය සහායකවරියක මෙම අංශයට අනුයුක්තව සේවය කරයි.

2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පුහුණු අංශයට පැවරී ඇති වගකීම් වනුයේ ,සමාජ සුභසාධන ක්‍රම සහ සමාජ සංවර්ධන වැඩසටහන් පිළිබඳ අධ්‍යයන කටයුතු පැවැත්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීමසමාජ , වැඩ වලදී තාක්ෂණය උපයෝගී කරගැනීම ඇතුලුව සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපන ක්‍රමයෙහි නිර්මාණාත්මක පරිචයක් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ,ඒ හා සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම හා සමාජ සුභසාධනයෙහි නිරත නිළධරයන් සහ වෙනත් කාර්ය මණ්ඩල සඳහා පුහුණුවීමේ පාඨමාලා සහ ශික්ෂණ වැඩසටහන් පවත්වාගෙන යාමයි.

සංවර්ධනය හා සම්බන්ධ ක්ෂේත්‍රයන් හා බැඳුණු පුහුණු වැඩසටහන් මෙම අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර, වෙනත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සඳහා ද පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. එසේම පුහුණු අංශය පුහුණු කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන හා ඒ ආශ්‍රිත ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් සංවිධානය කරනු ලැබේ. පුහුණු අංශය මගින් සිදුකරනු ලබන අධ්‍යයනික කාර්යභාරයන් වඩාත් පුළුල් කරමින් මෙම වසර තුළදී උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව ආරම්භ කිරීමේ අරමුණින් එහි අවශ්‍ය කටයුතු සිදුකරමින් තිබේ.සමාජ සුභසාධනය සහ සමාජ

සංවර්ධනය පිළිබඳ ඉල්ලුම මත පදනම් වූ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන් පැවැත්වීම, පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ ප්‍රජා නායකයින්, ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ප්‍රජා සංවර්ධනය පදනම් කරගත් ප්‍රජා පාදක පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධන සම්බන්ධ අධ්‍යයන පාඨමාලා හඳුන්වා දීම සහ පැවැත්වීම පුහුණු අංශයේ අරමුණු වේ.

මෙම අංශය මගින් දීර්ඝ කාලීන සහ කෙටි කාලීන පුහුණු වැඩසටහන් සහ පාඨමාලාවන් මෙන්ම අනෙකුත් වෘත්තීය පාඨමාලා ද සංවිධානය කරනු ලැබේ. එලෙස සංවිධානය කරනු ලබන අධ්‍යයනික පාඨමාලා පහත ආකාර වේ. උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව, උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව,වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ළමා ආරක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, සමාජ රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, ප්‍රජාපාදක විශෝධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, ළමා පාදක ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව, විශේෂ අධ්‍යාපනය ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව හා සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව වේ.

මෙම වැඩසටහන් සිංහල, ඉංග්‍රීසි හා දෙමළ යන මාධ්‍ය ත්‍රිත්ත්වයෙන් ම පැවැත්වීමේ හැකියාව පවතින අතර, අදාළ අධ්‍යයනික වැඩසටහනට පවතින ඉල්ලුමට අනුව භාෂා මාධ්‍යය තීරණය කෙරේ. පුහුණු අංශය වෙත ලැබෙන ඉල්ලුම මත පදනම්ව පහත ආකාරයේ කෙටිකාලීන පුහුණු වැඩසටහන් ද සංවිධානය කරනු ලැබේ.

උපදේශන මැදිහත්කරණ ක්‍රමශිල්ප, විශෝධන සේවා හා බැඳුනු උපදේශනය, මත්ද්‍රව්‍ය සඳහා උපදේශනය, මෘදු කුසලතා, සිද්ධි කළමනාකරණය සඳහා මූලික කුසලතා, පවුල් සමඟ වැඩ කිරීම සඳහා මූලික කුසලතා, කණ්ඩායම් සමඟ වැඩ කිරීම සඳහා මූලික කුසලතා, ප්‍රජාව සමඟ වැඩ කිරීම සඳහා මූලික කුසලතා, නායකත්වය, ගැටුම් කළමනාකරණය , සතුටු පවුල, උපදේශනය තුළ තක්සේරුකරණය, ආතතිය සහ මනෝවිද්‍යාත්මක උපදේශනය, අනපේක්ෂිත ගැබ්ගැනීම් සහ උපදේශනය, සමාජ භීතිකාව කළමනාකරණය කිරීම, , සමාජ රැකවරණය, වැඩ පරිසරය සහ සාමාන්‍ය ජීවිතය සමබර කරගැනීම සඳහා ජීවන කුසලතා, ළමා සංවර්ධනය, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වෙනුවෙන් සමාජ වැඩ මැදිහත්කරණය, ව්‍යාපෘති ලිවීම සඳහා වැඩමුලු, ප්‍රජා ව්‍යාපෘති කළමනාකරණය සඳහා වැඩමුලු, වැඩිහිටි රැකවරණය සඳහා උපදේශන මැදිහත්කරණය, දුගීබව අවම කිරීමේ ක්‍රමෝපාය සහ තිරසාර ජීවන සංවර්ධනය, ගැටුම් නිරාකරණය සඳහා ප්‍රජා සංවර්ධනය සහ ප්‍රජා මූල කළමනාකරණය හා ධාරිතාව ගොඩනැවීමේ පුහුණු වැඩසටහන් ඒ අතර වේ.

## 2023 වර්ෂයේදී පුහුණු අංශය මගින් පැවැත්වූ අධ්‍යයන පාඨමාලා
## උපාධි පාඨමාලා

### 1. උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව ආරම්භ කිරීම

**හැඳින්වීම**

රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන අංශයන්ගෙන් පවා උපදේශනය පිළිබඳ උපාධි පාඨමාලාවක් සඳහා ඉල්ලුම අප ආයතනය වෙත ලැබී ඇත. තවද ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතික පසුබිම තුළ විවිධාකාර ගැටලුවලට පුද්ගලයින් මුහුණපාන අතර, ඒවා විසඳා ගැනීමෙහිලා වෘත්තිය මැදිහත්කරණයක අවශ්‍යතාව මතුව ඇත. එම අධ්‍යයනික අවශ්‍යතාව තෘප්ත කිරීමෙහි අරමුණින් මෙම උපාධි පාඨමාලාව ආරම්භ කිරීම සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනය මෙම වසර තුළදී කටයුතු ආරම්භ කර තිබේ.

බහු සංස්කෘතික ඉලක්ක කණ්ඩායම් සඳහා තනි පුද්ගල, කණ්ඩායම් සහ පවුල් උපදේශනය ඵලදායී ලෙස සැපයීම සඳහා දැනුම සහ කුසලතා ලබා දීම, විවිධ පුද්ගලයින් හා කණ්ඩායම් සමග අන්තර් සම්බන්ධතා ගොඩනගා ගැනීම තුළින් ස්වයං ආවර්ජනය කිරීමට හා ස්වයං ඇගයීමට මෙන්ම ඵලදායී සහායක් ලබාදීමට ඇති කැමැත්ත හා හැකියාව ප්‍රදර්ශනය කිරීම, උපදේශන භාවිතයේදී අදාළ තක්සේරුකරණ මෙවලම් යෙදීම, මානව සංවර්ධන අවධීන් හා සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම, අන්තර්විෂයික කණ්ඩායම් සමග වැඩ කිරීමේදී වෘත්තීය කුසලතා සංවර්ධනය කිරීම, තනි පුද්ගල හා කණ්ඩායම් උපදේශනයෙහි ඵලදායී ශිල්පීය ක්‍රම සහ කුසලතා ප්‍රදර්ශනය කිරීම, මානසික අක්‍රමතා සහිත පුද්ගලයින් සමග මැදිහත්වීම සැලසුම් කිරීම, අවශ්‍යතා ඇති අය සඳහා මැදිහත්වීමේ ක්‍රියාවලියක් සංවර්ධනය කිරීම, උපදේශන අධ්‍යාපනයේ කාර්යභාරය හා වගකීම්, වටිනාකම් හඳුනාගැනීම, උපදේශනයේදී පර්යේෂණ හා අධීක්ෂණය සිදු කිරීම හා අවදානම් කණ්ඩායම් හා ආන්තික ජනගහනය සඳහා වෘත්තීය උපදේශන සේවා සැපයීම මෙම උපාධි පාඨමාලාවේ අපේක්ෂිත අරමුණු වේ.

යෝජිත උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාවේ විෂය සමාලෝචන පළමු වාර්තාව ලැබී ඇති අතර, එහි සමාලෝචන වාර්තාව ද සකස් කොට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙම වසරේදී භාර දෙන ලදි. ඒ අනුව එහිදී තීරණය වූයේ පවතින අඩුපාඩු සලකා බලා උපාධි පාඨමාලාවට අදාළ නව යෝජනා පත්‍රයක් ඉදිරිපත් කරන ලෙසය.

## උසස් ඩිප්ලෝමා / ඩිප්ලෝමා පාඨමාලා

### 1. උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

**හැඳින්වීම**

උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව, සති අන්ත අධ්‍යයන පාඨමාලාවක් වශයෙන් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම උසස් ඩිප්ලෝමා පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිකන නිර්දේශයන්ට අනුකූල වන පරිදි සීදූව මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගනිමින් සැලසුම්කොට පවත්වාගෙන යයි. උපදේශන ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක බවින් හෙබි වෘත්තිකයන් බිහිකිරීම, උපදේශන වෘත්තිකයන්ගේ උසස් වෘත්තීය කුසලතා පුළුල් කිරීම හා උපදේශන වෘත්තිකයාගේ මැදිහත්වීමේ හැකියාව සංවර්ධනය කිරීම මෙම පාඨමාලාවේ අරමුණු වේ. දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සැකැස්ම සහිත මනා පරිචයන්ගෙන් යුතු වෘත්තීය උපදේශකවරුන් බිහිකිරීම මෙහි ඉලක්කය වේ. මෙම පාඨමාලාව සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන අතර, කාලය මාස 21කි. මෙම පාඨමාලාවෙහි මාස 03ක ක්ෂේත්‍ර පුහුණුවක් අන්තර්ගත වේ (සති අන්ත පාඨමාලාවකි). පාඨමාලාවේ සම්පූර්ණ සම්මාන ඒකක (credit) 32කි. දේශන පැය 420 ක් සහ ක්ෂේත්‍ර පුහුණුව පැය 200 කි. ඒ අනුව මුළු පැය ගණන පැය 620 කි. උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව පාඨමාලා ඒකක 07 හා ක්ෂේත්‍ර පුහුණුව යන සංරචකයන්ගෙන් සමන්විත විය.

**2023 වර්ෂය තුළ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වූ ස්ථාන**

ජාතික සමාජ සංවර්ධන ආයතනය, සීදූව ප්‍රධාන මධ්‍යස්ථානය (සිංහල)

### 2. උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

**හැඳින්වීම**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය විසින් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සති අන්ත අධ්‍යයන පාඨමාලාවක් වශයෙන් පවත්වාගෙන යනු ලැබේ. මෙම පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිකන නිර්දේශයන්ට (SLQF) අනුකූලවන පරිදි සකස්කර ඇත. දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සැකැස්ම සහිත මනා පරිචයන්ගෙන් යුතු වෘත්තීය උපදේශකවරුන් බිහිකිරීම මෙහි ඉලක්කය වේ. උපදේශන ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක බවින් හෙබි වෘත්තිකයන් බිහිකිරීම, උපදේශන වෘත්තිකයන්ගේ වෘත්තීය කුසලතා පුළුල් කිරීම හා උපදේශන වෘත්තිකයාගේ මැදිහත්වීමේ හැකියාව සංවර්ධනය කිරීම පාඨමාලාවේ අරමුණු වේ. සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍ය ත්‍රිත්ත්වයෙන්ම පැවැත්වෙන මෙම පාඨමාලාවේ කාල සීමාව මාස 21 කි. මෙම පාඨමාලාවේ මාස 06ක ක්ෂේත්‍ර පුහුණුවක් අන්තර්ගත වේ. (සති අන්ත පාඨමාලාවකි). පාඨමාලාවේ සම්පූර්ණ සම්මාන ඒකක (credit) 30කි. දේශන පැය 405 ක් සහ ක්ෂේත්‍ර පුහුණුව පැය 150 කි. ඒ අනුව මුලු පැය ගණන පැය 555 කි. උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව විෂය එකක් 09ක්, ක්ෂේත්‍ර පුහුණුව හා අධ්‍යයන චාරිකාව යන අංගයන්ගෙන් සමන්විත වේ.

**2023 වර්ෂය තුළ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වූ ස්ථාන**

ජාතික සමාජ සංවර්ධන ආයතනය, සීදූව ප්‍රධාන මධ්‍යස්ථානය (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය), ප්‍රජා පාදක විශෝධන නිළධාරීන් සඳහා - මාතර, කුරුණෑගල හා රත්නපුර, ප්‍රජා පාදක විශෝධන නිළධාරීන් සඳහා - කිලිනොච්චිය (දෙමළ මාධ්‍ය), තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානය, අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානය (සිංහල හා දෙමළ), රත්නපුර, කුරුණෑගල, රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානය, නුවර (දෙමළ මාධ්‍ය), පුත්තලම (දෙමළ මාධ්‍ය), කිලිනොච්චිය (දෙමළ මාධ්‍ය), මඩකලපුව (දෙමළ මාධ්‍ය), යාපනය (දෙමළ මාධ්‍යය), ත්‍රිකුණාමලය (දෙමළ මාධ්‍ය), හැටන් (දෙමළ මාධ්‍ය) හා වවුනියාව (දෙමළ මාධ්‍ය)

**සහතිකපත්‍ර පාඨමාලා**

1. **සමාජ වැඩ සහතික පත්‍ර පාඨමාලාව**

**හැඳින්වීම**

සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සමාජ වැඩ විෂය හා සම්බන්ධ වෘත්තිකයන් හා සමවෘත්තිකයන්ගේ සමාජ වැඩ කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින් සකස් කර ඇත. මෙමගින් තනිපුද්ගල, කණ්ඩායම් සහ ප්‍රජාවන් සවිබල ගැන්වීම තුළින් ඔවුන්ගේ ආර්ථික හා සමාජ සංවර්ධනය ඇති කිරීම තවදුරටත් අරමුණු වේ. තවද ශ්‍රී ලංකාව තුළ ඵලදායී සමාජ සුභසාධන සේවාවන් ව්‍යාප්ත කිරීම ද මෙමගින් බලාපොරොත්තුවේ. දැනුම, කුසලතා හා ආකල්පයන්ගෙන් හෙබි සමාජ වැඩ වෘත්තිකයන් හා සම- වෘත්තිකයන් බිහිකිරීම මෙම පාඨමාලාවේ ඉලක්කය වේ. සමාජ වැඩ ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක බවින් හෙබි වෘත්තිකයන් හා සම - වෘත්තිකයන් බිහිකිරීම, බලගැන්වීමේ ප්‍රවේශය යොදාගනිමින් සමාජ සුභසාධන සේවාවන්හි නියුතු සේවා සපයන්නන්ගේ වෘත්තීය කුසලතා පුළුල් කිරීම හා තිරසාර සංවර්ධනය සඳහා තනි පුද්ගල, පවුල්, කණ්ඩායම් සහ ප්‍රජාවන්ගේ සමාජ සුභසාධන හා සමාජ සංවර්ධනය ගැටලු වලට මැදිහත්කරණය කිරීමේ හැකියාව මෙවැනි නිලධාරීන් හා සේවා සපයන්නන් තුළ සංවර්ධන කිරීම පාඨමාලා අරමුණු වේ. සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වෙන මෙම පාඨමාලාවේ කාලය මාස 06 කි. මෙම පාඨමාලාවේ පැය 150 ක ක්ෂේත්‍ර පුහුණුවක් අන්තර්ගත වේ (මෙය සතියේ දිනවල සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා පවත්වන ලදී.)

පාඨමාලාවේ සම්පූර්ණ සම්මාන ඒකක (credit) 15 කි. දේශන පැය 180ක් සහ ක්ෂේත්‍ර පුහුණුව පැය 150 කි. ඒ අනුව මුලු පැය ගණන පැය 330 කි. සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව විෂය ඒකක 04 ක් හා ක්ෂේත්‍ර පුහුණුව යන අංගයන්ගෙන් සමන්විත වේ.

මෙම සහතික පත්‍ර පාඨමාලාව 2022.12.23 දින සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙනුවෙන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ආරම්භකරන ලදි. මෙම සහතික පත්‍ර පාඨමාලාව සිංහල හා දෙමළ මාධ්‍ය ඔස්සේ පවත්වන ලදී. පුහුණුව සාර්ථකව අවසන්කල නිලධාරීන් 200 දෙනෙකු දිවයින් පුරා ඇති ප්‍රාදේශිය මධ්‍යස්ථානයන්හීදී අවසන් පැනල මණ්ඩල ඉදිරිපත් කිරීම් සඳහා සහභාගී විය.





(සමාජ වැඩ සහතික පත්‍ර පාඨමාලාවේ පැනල මණ්ඩල පැවැත්වීම)

## 2. ළමා කේන්ද්‍රීය ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (සිංහල හා දෙමළ මාධ්‍ය)

**හැඳින්වීම**

මෙම සහතික පත්‍ර පාඨමාලාව ශ්‍රී ලංකාවේ ප්‍රජාපාදක ළමාරක්‍ෂණ පද්ධතිය සහ ළමා සුභසාධනය සංවර්ධන කිරීම සඳහා වෘත්තිකයන් හා සම-වෘත්තිකයන්ගේ කුසලතා සංවර්ධන අරමුණු කරගනිමින් නිර්මාණය කර ඇත. ප්‍රජා මට්ටම තුළ මනා පුහුණුව සඳහා දැනුම හා කුසලතා සංවර්ධනය, ළමා රක්‍ෂණය සහ සුභසාධනය පිළිබඳ වෘත්තිකයන් හා සම වෘත්තිකයින් බිහි කිරීම හා ප්‍රජා මට්ටම තුළ ළමා අයිතිවාසිකම් උල්ලංඝණය වන සමාජ ව්‍යුහය අභියෝගයට ලක් කිරීම හා ළමා අයිතිවාසිකම් මත පදනම්ව දිළිඳු කම තුරන්කිරීමේ මූලධර්ම ආමන්ත්‍රණය කිරීම පාඨමාලාවේ ඉලක්ක වේ.

ප්‍රජා පාදක ළමා ආරක්‍ෂණ ක්ෂේත්‍රය තුළ ගුණාත්මක බවින් හෙබි වෘත්තිකයන් / සමවෘත්තිකයන් බිහිකිරීම, ප්‍රජා පාදක ළමා සංවර්ධන මොඩලය භාවිතා කරමින් ළමා සුභ සාධන, ළමුන් රැකබලා ගැනීම හා ළමා ආරක්‍ෂණ සේවා සපයන්නන්ගේ වෘත්තීය කුසලතා පුළුල් කිරීම හා තිරසාර ප්‍රජා සංවර්ධනය සඳහා තනි පුද්ගල, පවුල්, කණ්ඩායම් සහ ප්‍රජාවන්ගේ ළමා ආරක්‍ෂණය පිළිබඳ ගැටලු වලට මැදිහත්කරණය කිරීමේ හැකියාව මෙවැනි නිලධාරීන් හා සේවා සපයන්නන් තුළ සංවර්ධන කිරීම පාඨමාලා අරමුණු වේ. සිංහල හා දෙමළ මාධ්‍ය යෙන් පැවැත්වෙන මෙම පාඨමාලාවේ කාල සීමාව මාස 06 සිට මාස 09 දක්වා වේ. තවද මාස 03 ක ක්ෂේත්‍ර පුහුණුවක් අන්තර්ගත වේ. මෙම පාඨමාලාවේ සම්පූර්ණ සම්මාන ඒකක (credit) 15 කි. දේශන පැය 180 ක් සහ ක්ෂේත්‍ර පුහුණුව පැය 150 කි. ඒ අනුව මුලු පැය ගණන පැය 330 කි. ළමා කේන්ද්‍රීය ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව විෂය ඒකක 04 ක් හා ක්ෂේත්‍ර පුහුණුව යන අංගයන්ගෙන් සමන්විත වේ.

මෙම සහතික පත්‍ර පාඨමාලාව සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. සිංහල පාඨමාලාව ශුද්ධ වූ පවුලේ කන්‍යාරාම මූලස්ථානයේ ඉල්ලීම මත ළමුන් සමග කටයුතු කරන කන්‍යා සොයුරියන් 18 දෙනෙකු වෙනුවෙන් 2022.12.08 දින මාර්ගගත ක්‍රම වේදය ඔස්සේ ආරම්භකරන ලදී.

දෙමළ පාඨමාලාව සඳහා අයදුම්පත් යොමු කරන ලද සිසුන් 19 දෙනෙකු වෙනුවෙන් 2022.12.08 වන දින මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ආරම්භ කරන ලදි. මෙම සහතික පත්‍ර පාඨමාලා ද්විත්වය 2023 වසරේ සාර්ථක ලෙස අවසන් කරන ලදි.

**03. උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

**හැදින්වීම.**

උපදේශනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව මගින් ඵලදායී සේවා සැපයීම ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විවිධ රැකියා කාණ්ඩවල පුද්ගලයින් සමඟ කටයුතු කරන මානව සේවා ශ්‍රමිකයින් සහ වෙනත් පුද්ගලයින් තුළ උපකාරක කුසලතා වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. මානව සේවා කම්කරුවන් තුළ කුසලතා වර්ධනය කරන විට ඔවුන්ගේ රැකියා වඩා හොඳින් ඉටු කිරීම සඳහා සේවා පරිශීලකයින් සමඟ සහයෝගී වැඩ පරිසරයක් නිර්මාණය කිරීමට ඔවුන්ට උපකාරී වේ. මෙම පාඨමාලාව ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතිකකරණයට අනුකූලව සකස් කර ඇත. උපදේශනය පිළිබඳ මෙම උසස් සහතික පත්‍ර පාඨමාලාව SLQF 02 වන මට්ටම වන අතර NVQ 3 වන මට්ටමට සමාන වන අතර උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව SLQF 01 මට්ටම වන අතර අවම ක්‍රෙඩිට් අගය 10 ක් වන අතර එය NVQ 2 මට්ටමට අනුකූල වේ.
මෙම සහතික පත්‍ර පාඨමාලාව සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. සිංහල පාඨමාලාව ලියාපදිංචි ශිෂ්‍යයන් 27 දෙනෙකු වෙනුවෙන් 2022.11.29 දින මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ආරම්භකරන ලදී.

**කෙටිකාලීන පුහුණු වැඩසටහන්**

**පුහුණු අංශය භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන් හි සාරාංශය පහත පරිදි වේ.**

| අනු අංකය | වැඩසටහන | මධ්‍යස්ථානය | සහභාගීත්වය | සංඛ්‍යාව | වියදම |
|---|---|---|---|---|---|
| 01 | ක්ෂේත්‍ර පුහුණු නිලධාරීන් පුහුණු කිරීම | සීදුව | ක්ෂේත්‍ර පුහුණු නිලධාරීන් සඳහා | 96 | 10,000.00 |
| 02 | “වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ ඇතිවන මනෝ විද්‍යාත්මක ගැටලු, ජීවනෝපාය සවිබල ගැන්වීම සඳහා සහාය වීම |  | ග්‍රාම නිලධාරී, ක්ෂේත්‍ර නිලධාරී හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා | 35 | 10,000.00 |
| 03 | වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ ඇතිවන මනෝ විද්‍යාත්මක ගැටලු, ජීවනෝපාය සවිබල ගැන්වීම සඳහා සහාය වීම | අම්පාර | පදියතලාව මධ්‍ය මහා විද්‍යාලීය 10,11,12,13 ශ්‍රේණින් වල ඉගෙනගන්නා සිසු සිසුවියන් සඳහා | 70 | 10,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 04 | දරුවන්ගේ සුරක්ෂිත භාවය උදෙසා දෙමාපිය කාර්යභාරය | | ලාහුගල වසමේ ග්‍රාම නිලධාරීන් හා අම්පාර දිස්ත්‍රික් කාර්යාලීය නිලධාරීන් සඳහා | 36 | 10,000.00 |
| 05 | ධාරිතා සංවර්ධනය | | කොටවෙහෙර ප්‍රාදේශිය ලේකම් කාර්යාලීය ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා | 66 | 10,000.00 |
| 06 | සමාජ මැදිහත්කරණය | තලාව | උතුරු මැද පළාත් ප්‍රජා පාදක විශෝධන කාර්යාලිය නිලධාරීන් සඳහා | 30 | 10,000.00 |
| 07 | සමාජ මැදිහත්කරණය | | උතුරු මැද පළාත් ප්‍රජා පාදක විශෝධන කාර්යාලිය නිලධාරීන් සඳහා | 30 | 10,000.00 |
| 08 | සන්නිවේදන, සම්බන්ධතා ගොඩනැංවීම හා කාල කළමනාකරණය කුසලතා ගොඩනැංවීම. | | මුලතිව් දිස්ත්‍රික් රෝහල් කාර්ය මණ්ඩලයේ සඳහා | 50 | 10,000.00 |
| 09 | සන්නිවේදන, සම්බන්ධතා ගොඩනැංවීම හා කාල කළමනාකරණය කුසලතා ගොඩනැංවීම. | කිලිනොච්චිය | මුලතිව් දිස්ත්‍රික් රෝහල් කාර්ය මණ්ඩලයේ සඳහා | 50 | 10,000.00 |
| 10 | දෙමාපියන්ගේ හා ප්‍රාජා නායකයින්ගේ කාර්යභාරය | | මරතනගර් ප්‍රජා නායකයින් හා දෙමාපියන් සඳහා | 53 | 10,000.00 |
| | | | **එකතුව** | **516** | **100,000.00** |

**පුහුණු අංශය මගින් නොමිලේ පවත්වන ලද කෙටි කාලීන පුහුණු වැඩසටහන්හි සාරාංශය පහත පරිදි වේ.**

| අනු අංකය | වැඩසටහන | මධ්‍යස්ථානය | සංඛ්‍යාව | වියදම |
|---|---|---|---|---|
| 01 | වෘත්තීය සංවර්ධනය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන | හ/උඩමලල මහා විද්‍යාලයේ ගුරුවරුන් සඳහා | 35 | නොමිලේ පවත්වන ලදි. |
| 02 | උපදේශනය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන | කටුකුරුන්ද විශේෂ කාර්යබලකාය | 35 | නොමිලේ පවත්වන ලදි. |
| 03 | ශිෂ්‍ය අභිප්‍රේරණය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන | කටුකුරුන්ද විශේෂ කාර්යබලකාය | | |
| 04 | උපදේශනය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන | කැකිරාව කලාප අධ්‍යාපන කාර්යාලීය නිලධාරීන් සඳහා | 60 | නොමිලේ පවත්වන ලදි. |

| | | | | |
|---|---|---|---|---|
| 05 | කුසලතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | මාර/මාරබ කනිශ්ඨ විද්‍යාලයේ ගුරුවරුන් සඳහා | 18 | නොමිලේ පවත්වන ලදි. |
| 06 | නායකත්වය හා ක්ලමථ කළමණාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | මාතර වෘත්තීය පුහුණු අධිකාරියේ ඉගෙනුම ලබන සිසුන් සඳහා | 18 | නොමිලේ පවත්වන ලදි. |
| 07 | කෙටිකාලීන පුහුණු වැඩසටහන | උතුරු මැද පලාත් පරිවාස නිලධාරීන් සඳහා | 19 | නොමිලේ පවත්වන ලදි |
| 08 | නායකත්වය හා ක්ලමථ කළමණාකරණයපිළිබඳ පුහුණු වැඩසටහන | මාර/මාරබ කනිෂ්ඨ විද්‍යාලයේ පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා | 55 | නොමිලේ පවත්වන ලදි |
| 09 | වර්තමාන ආර්ථික අර්බුද හමුවේ මනෝ විද්‍යාත්මක ගැටළු ජීවනෝපාය සවිබලගැන්වීම සඳහා සහාය වීම | ග්‍රාම නිලධාරීන්, ක්ෂේත්‍රනිලධාරීන් සහ සමෘද්ධි නිලධාරීන් සඳහා | 40 | නොමිලේ පවත්වන ලදි |
| 10 | උපදේශනය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන | සීදූව රෝහල් හෙද කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා | 30 | නොමිලේ පවත්වන ලදි. |
| | **එකතුව** | | 310 | |

පුහුණු අංශය භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන් සහ පුහුණු අංශය මගින් නොමිලේ පවත්වන ලද කෙටි කාලීන පුහුණු වැඩසටහන් සඳහා සහභාගීත්වය 826 කි. (516 + 310 = 826)

භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් පවත්වන ලද අනෙකුත් වැඩසටහන් කෙටිකාලීන පුහුණු වැඩසටහන්

| අනු අංක | විස්තරය | වියදම රු. |
|---|---|---|
| 01. | ඉංග්‍රීසි භාෂා සහ සංස්කෘතික අධ්‍යන කටයුතු සමගාමීව ඉංග්‍රීසි භාෂාව පුහුණු කිරීමට අදාලව විෂයමාලා සංවර්ධන කටයුතු සිදු කිරීම | 210,000.00 |
| 02. | නියෝජිත ආයතන ක්ෂේත්‍ර සහ පීඨ අධීක්ෂකවරුන් 130ක් පුහුණු කිරිම | 10,000.00 |

**2023 පුහුණු අංශයේ ගාස්තු අය කිරීමේ උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන් හි ලද ආදායම**

| අනු අංකය. | පාඨමාලාව | අයකරන ලද ගාස්තුව රු. | සිසුන් ගණන | ආයතනය වෙත මුදල් ලැබීම (රු.) | |
|---|---|---|---|---|---|
| 01 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) 2021/2022 2022/2023 2023/2024 | 61,000.00 | 650 දෙනෙකු ලියාපදිංචි වූ අතර සිසුන් 623දෙනෙකු පාඨමාලාව හදාරණු ලබයි. | දෙවන වාරිකය සහ පළමු වාරිකය හෝ පාඨමාලා ගාස්තුවේ ඉතිරි මුදල් | 12,190,000.00 |
| | මුළු එකතුව | | | | **12,190,000.00** |

**2023 පුහුණු අංශයේ ගාස්තු අය කිරීමේ වෙනත් පාඨමාලාවන්**

| අනු අංකය. | පාඨමාලාව | අයකරන ලද ගාස්තුව රු. | සිසුන් ගණන | ආයතනය වෙත මුදල් ලැබීම (රු.) | |
|---|---|---|---|---|---|
| 01 | උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල) 2022/2023 | 76,000.00 | 23 දෙනෙකු ලියාපදිංචි වූ අතර සිසුන් 21 දෙනෙකු පාඨමාලාව හදාරා අවසන් | දෙවන වාරිකය | 30,000.00 |
| 02 | උපදේශනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව (සිංහල) 2022/2023 | 11,000.00 | 24 දෙනෙකු පාඨමාලාව හදාරා අවසන් | | 264,000.00 |
| 03 | දිසා හා මහේස්ත්‍රාත් අධිකරණවලට අනුයුක්ත විනිසුරුවරුන් පුහුණු කිරීම (ආසියානු පදනම) | | විනිසුරුවන් 50 | | 1,585,761.10 |
| | මුළු එකතුව | | | | **1,879,761.10** |

## සීදූව ප්‍රධාන මධ්‍යස්ථානය

### 1. දිසා හා මහේස්ත්‍රත් අධිකරණවලට අනුයුක්ත විනිසුරුවරුන් පුහුණු කිරීම

ඉහත වැඩසටහන 2023 අගෝස්තු සිට සැප්තැම්බර් දක්වා සේවාස්ථ පුහුණු වැඩසටහනක් ලෙස දිසා හා මහේස්ත්‍රත් අධිකරණවලට අනුයුක්ත විනිසුරුවරුන් 50 ක් සඳහා පැවැත්වීම සඳහා සැලසුම් කරන ලදී.

**පරමාර්ථය:**

I. දික්කසාදය සහ වෙන්වීම වටා ඇති විවිධ මනෝ සමාජීය ගැටළු පිළිබඳව දැනුම යාවත්කාලීන කිරීම,

II. දික්කසාදයෙන් වෙන්වන කාලත්‍රයාගේ සහ දරුවන්ගේ සුභසාධනයට ප්‍රමුඛත්වය දෙන ආකාරයෙන් තීරණ ගැනීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම.මෙම පුහුණු වැඩසටහන ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් විනිසුරුවන්ගේ ආයතනය සහ ආසියා පදනමේ සහයෝගීත්වය යටතේ පවත්වන ලදී.

**ප්‍රතිඵලය:** ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්කවල සභාපතිත්වය දරන දිසා හා මහේස්ත්‍රාත් අධිකරණ විනිසුරුවරුන් සහ මනෝ විද්‍යාඥ සහ සායනික විශේෂඥ මනෝ වෛද්‍යවරු පොදු වේදිකාවකට ගෙන ඒමටත්, රට තුළ පවතින දික්කසාදයේ තත්ත්වය සහ දික්කසාදවල ප්‍රතිවිපාක විශේෂයෙන් ම දරුවන්ගේ කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ දැනුවත් කිරීමට හැකි විය.






(දිසා හා මහේස්ත්‍රාත් අධිකරණවලට අනුයුක්ත විනිසුරුවරුන් පුහුණු කිරීම)

## 2. වාර්ෂික ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් පුහුණු කිරීමේ වැඩසටහන

පුහුණු අංශය මගින් ක්‍රියාත්මක කරන උපදේශනය හා අනෙකුත් උසස් ඩිප්ලෝමා, ඩිප්ලෝමා හා සහතිකපත්‍ර පාඨමාලාවන් හී ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් ලෙස කටයුතු කරන වෘත්තිකයන් පුහුණු කිරිම හා ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරිම හරහා එකී පාඨමාලවන්හී ප්‍රමිතිය ඉහල නැංවිම මෙම වැඩසටහනේ පරමාර්ථයයි. වැඩ සටහන සිංහල හා දෙමළ මධ්‍යයන්ගෙන් මාර්ගගත ක්‍රමය හරහා පවත්වන ලදි.

**දිනය**

- 2023.11.07 - සිංහල මාධ්‍ය
- 2023.11.17 - දෙමළ මාධ්‍යය

**සම්පත් දායකත්වය**

- විශේෂඥ මනෝ වෛද්‍ය දර්ශනී බුද්ධිකා හෙට්ටිආරච්චි මහත්මිය - සිංහල මාධ්‍යය
- විශේෂඥ මනෝ වෛද්‍ය එම්. ගනේෂන් මහතා - දෙමළ මාධ්‍යය

**සහභාගීවූ පිරිස**

- සිංහල මාධ්‍යය නිලධාරීන් 98 ක්
- දෙමළ මාධ්‍යය නිලධාරීන් 76 ක්

**ප්‍රතිඵලය**

- අවශ්‍යතා සහිත ළමුන් හා යෞවනයන් සම්බන්ධව මැදිහත්කරණය සිදුකිරීමේදී භාවිතකල හැකි අළුතින් හඳුනාගත් චිකිත්සා ක්‍රම පිළිබඳව සහභාගීවන්නන්ට දැනුම ලබා දීම හරහා ඔවුන් විසින් සිදුකරන ශිෂ්‍ය අධීක්ෂණ කටයුතු වල ප්‍රමිතිය ඉහල නැංවීම.

## 3. ක්ලමත කළමනාකරණය හා උපදේශනය පිළිබඳ වැඩසටහන

**දිනය**

- 2023.12.06

**වේලාව**

- පෙ.ව - 9.30.ප.ව.400.

**වැඩසටහනේ නම**

- ක්ලමත කළමනාකරණය හා උපදේශනය පිළිබඳ වැඩසටහන

**දේශකවරයා**

- පුහුණු කිරිමේ නිළධාරී, බී.කේ.එස්. කරුණාරත්න

**සහභාගිවූවන්ගේ ස්වභාවය**

- කටුකුරුන්ද පොලිස් විශේෂතාර්ය බලකායේ කඳවුරු දෙවන අණදෙ නිලධාරීන් 15 දෙනෙකු

**පුහුණු ක්‍රමවේදය**

- පංති කාමර දේශන, කණ්ඩායම් සාකච්ඡා, ක්‍රියාකාරකම්, විඩියෝ දර්ශන

**සහභාගිවූවන්ගේ ඇගයීම හා නිගමන හා නිර්දේශ -**

- වැඩසටහන පිළිබඳ යහපත් ප්‍රතිචාර ලැබුණු අතර ඔවුනට තම වෘත්තිය ජීවිතය වඩා සාර්ථක කරගනිමින් තම සේවය වඩා ඵලදායි ලෙස සමාජය වෙත ලබාදීමට අවශ්‍ය දැනුම කුසලතාවය හා උත්ප්‍රේරණය මෙම සැසිය හරහා ලැබුණු බවත් මෙවැනි වැඩසටහන් ඉදිරියේදී තවදුරටත් සංවිධානය කිරීම අත්‍යාවශ්‍ය බව ඔවුනගේ අදහස විය.



(පොලිස් විශේෂකාර්ය බලකාය සඳහා ක්ලමත කළමනාකරණය හා උපදේශනය පිළිබඳ පුහුණු වැඩසටහන)

# ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන පිළිබඳ විස්තර

## සමාජවැඩ පුහුණු, පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය, රන්න

### හැඳින්වීම

දකුණු පළාතෙහි හම්බන්තොට දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් 2014.11.05 වන දින ශ්‍රී ආනන්ද හිමි පෙදෙස, අඩි 100 පාර, රන්න යන ලිපිනයෙහි ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජවැඩ පුහුණු,පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය ආරම්භ කරන ලදි. මධ්‍යස්ථානයට ගොඩනැගිලි 02 අයත්වන අතර එහි සිසුන් 50 දෙනෙකුටපහසුකම් සැලසිය හැකි පංති කාමර දේශනශාලා 02ක් ,නේවාසික පහසුකම් ලබාගැනිම සඳහා කාමර 03 ක්, කාර්යාල කාමරයක් හා කුඩා සම්මන්ත්‍රණ ශාලාවකින් සමන්විත වේ.

### කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| අනු අංකය | තනතුර | සිටින සංඛ්‍යාව |
|---|---|---|
| 01 | වැඩසටහන් සහකාර/ස්ථානභාර (වැඩ ආවරණ) | 01 |
| 02 | කළමනාකරණ සහකාර | 02 |
| 03 | කාර්යාල කාර්ය සහයක | 01 |

කොන්ත්‍රාත් පදනම මත සනීපාරක්ශක සේවකයකු හා එක් ආරක්ෂක නිළධාරියෙකු (රාත්‍රියට පමණි) සේවය කරනු ලැබේ.

**2023 වර්ෂයේ රන්න ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේ වියදම් වාර්තාව.**

| අනු අංකය | විස්තරය | මුදල (රු.) |
|---|---|---|
| 01 | විදුලි බිල්පත් | 18,509.87 |
| 02 | ජල බිල්පත් | 13,691.10 |
| 03 | දුරකථන බිල්පත් | 15,430.20 |
| 04 | පරිපාලන වියදම් | 71,425.00 |
| | **එකතුව** | **119,056.17** |

**2023 රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානය ලැබූ වාර්ෂික අමතර ආදයම**

| අනු අංකය. | පාඨමාලාව | අයකරන ලද ගාස්තුව රු. | සිසුන් ගණන | ආයතනය වෙත මුදල් ලැබීම (රු.) |
|---|---|---|---|---|
| 01 | කැම්ඩ් ආයතනය සඳහා දේශනශාලා පහසුකම ලබාදීම | | | 39,000.00 |
| 02 | නේවාසික ගාස්තු | | | 7,400.00 |
| | මුළු එකතුව | | | **46,400.00** |

**රන්න මධ්‍යස්ථානයේ 2023 වර්ෂයේ නොමිලේ පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන් විස්තර**

| අනු අංකය | දිනය | වැඩසටහන | සම්පත් දායකත්වය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. | 2023.02.20 | මාතර වෘත්තීය පුහුණු අධිකාරියේ නිලධාරීන් සඳහා (ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පාඨමාලා පිළිබඳ ප්‍රවර්ධන වැඩසටහන) | පුහුණු කිරිමේ නිළධාරි පි.සි හෙට්ටිආරච්චි මයා | 25 |
| 02. | 2023.11.21 | උණවටුන ප්‍රාදේශීය රෝහල මානසික සෞඛ්‍යය ප්‍රවර්ධන ප්‍රදර්ශනය උපදේශනය හා මනෝ සමාජීය කුසලතා පිළිබඳ දැනුවත් කිරිම | ප්‍රගිත් මුණසිංහ මහතා(ස්ථානභාර වැ/බ) | 400 |
| 03. | 2023.11.22 | අඟුණුකොළපැලැස්ස දිසා රෝහලේ කාර්ය මණ්ඩලය සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පාඨමාලා පිළිබඳ ප්‍රවර්ධන වැඩසටහන | ප්‍රගිත් මුණසිංහ මහතා(ස්ථානභාර වැ/බ) | 09 |
| 04. | 2023.11.22 | අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පාඨමාලා පිළිබඳ ප්‍රවර්ධන වැඩසටහන | ප්‍රගිත් මුණසිංහ මහතා(ස්ථානභාර වැ/බ), | 26 |

## සමාජවැඩ පුහුණු, පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය, අම්පාර






### හැඳින්වීම

නැගෙනහිර පළාතෙහි අම්පාර දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් 2013.07.01 වන දින ඩී25, නව නගරය, අම්පාර, යන ලිපිනයෙහි ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජවැඩ පුහුණු, පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී. මධ්‍යස්ථානයට ගොඩනැගිලි රජයේ නිල නිවාසයක් නවීකරණය කර භාවිතා කරනු ලබන අතර කාර්යාල කාමර 02 ක්, සිසුන් 30 පමන අසුන් ගැනිමට හැකිවන ලෙස සකසන ලද සාලයක්, දෙදෙනෙකුට නේවාසික විය හැකි නිදන කාමරයකින් ආයතනය සමන්විත වේ.

### කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| අනු අංකය | තනතුර | සිටින සංඛ්‍යාව |
|---|---|---|
| 01 | වැඩසටහන් සහකාර/ස්ථානභාර | 01 |
| 02 | කළමනාකරණ සහකාර | 02 |
| 03 | කාර්යාල කාර්ය සහයක | 01 |

### 2023 අම්පාර පුහුණු මධයස්ථානයේ වියදම් වාර්තාව

| අනු අංකය | විස්තරය | මුදල (රු.) |
|---|---|---|
| 01 | විදුලි බිල්පත් | 25,579.72 |
| 02 | ජල බිල්පත් | 18,015.44 |
| 03 | දුරකථන බිල්පත් | 20,909.52 |
| 04 | පරිපාලන වියදම් | 4,015.00 |
| 05 | මාසික කාර්යාල කුලිය | 16,500.00 |
| | **එකතුව** | **85,019.68** |

**2023 අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානය ලැබූ වාර්ෂික අමතර ආදයම**

| අනු අංකය. | පාඨමාලාව | අයකරන ලද ගාස්තුව රු | සිසුන් ගණන | මුදල් (රු) |
|---|---|---|---|---|
| 01 | වයිස් වේ හෝටෙල් පාසල සඳහා දේශනශාලා පහසුකම් ලබාදීම. | 4,000.00 | 10 | 40,000.00 |
| | **මුළු එකතුව** | | | **40,0000.00** |

**අම්පාර මධ්‍යස්ථානයේ 2023 වර්ෂයේ නොමිලේ පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන් විස්තර**

දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන හා විවිධ සිවිල් සංවිධානයන්ගේ ඉල්ලීම් අනුව නොමිලේ පවත්වන ලද දැනුවත් කිරිම්/කෙටිකාලීන පුහුණු පාඨමාලා වැඩසටහන් 23 මගින් දැනුවත් කරන ලදී. මුළු ප්‍රතිලාභින් ප්‍රමාණය 1361 කි.

| අනු අංකය | දිනය | වැඩසටහන | සම්පත් දායකත්වය | සහභාගි වු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. | 2023.07.25 | යොවුන්වියේ අභියෝග ජයගැනිම ජාතික තරුණ සේවා සභාව | ප්‍රගීත් ලසන්ත මුණසිංහ ස්ථානභාර නිළධාරි | 42 |
| 2. | 2023.06.21 | දහම්පාසල් ශිෂ්‍ය නායක නායිකාවන්ගේ නායකත්ව කුසලතා සංවර්දනය- අලියාඩුවෙම්බු ශාසනාරක්ෂක බලමණ්ඩලය | ප්‍රගීත් ලසන්ත මුණසිංහ ස්ථානභාර නිළධාරි | 88 |
| 3. | 2023.03.14 | ග්‍රාමිය ප්‍රජාවන්ගේ මනෝසමාජිය කුසලතා ප්‍රවර්දණ වැඩසටහන වැරැන්කැටගොඩ ග්‍රාම නිළධාරි වසම | විශේෂඥ මනෝ වෛද්‍ය සමිර රුවන්ප්‍රිය මහතා ප්‍රගීත් ලසන්ත මුණසිංහ ස්ථානභාර නිළධාරි | 124 |
| 4. | 2023.03.19 | ගෘහස්ත ප්‍රචණ්ඩත්වය අවම කිරිම සඳහා රජයේ නිළදාරින්ගේ ධාරිතා සංවර්ධනය අම්පාර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිළධාරි | ප්‍රගීත් ලසන්ත මුණසිංහ ස්ථානභාර නිළධාරි | 24 |
| 5. | 2023.05.10 | අධ්‍යාපන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දීමට සිටින පාසල් සිසුන්ගේ විභාග ආතතිය අවම කිරිමේ වැඩසටහන වැරැන්කැටගොඩ රජමහා විහාරය - උහන | ප්‍රගීත් ලසන්ත මුණසිංහ ස්ථානභාර නිළධාරි | 22 |
| 6. | 2023.03.11 | යොවුන්විය හා මත්ද්‍රව්‍ය ඇබ්බැහිය ජාතික තරුණ සේවා සභාව - අම්පාර | ප්‍රගීත් ලසන්ත මුණසිංහ ස්ථානභාර නිළධාරි | 65 |

| | | | | |
|---|---|---|---|---|
| 7. | 2023.02.03 | ප්‍රජා මූලික පුණරුත්ථාපනය<br>අම්පාර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | ප්‍රගීත් ලසන්ත මුණසිංහ<br>ස්ථානභාර නිළධාරි | 32 |
| 8. | 2023.09.19 | මානසික රෝග හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් පිළිබඳ සමාජ අවමානය අවම කිරිම<br>උහන හා අම්පාර ප්‍රාදේශිය ලේකම් කාර්යලා ක්ෂේත්‍ර නිළධාරින් | ප්‍රගීත් ලසන්ත මුණසිංහ<br>ස්ථානභාර නිළධාරි | 28 |
| 9. | 2023.04.23 | ආතති කළමණාකරන කුසලතා සංවර්දනය<br>අම්පාර පොලිස්ථානයේ කාන්ත අංශ නිළදාරින් | ප්‍රගීත් ලසන්ත මුණසිංහ<br>ස්ථානභාර නිළධාරි | 30 |
| 10. | 2023.05.21 | ළමා අපයෝජන අවම කිරිම සඳහා දේමාපිය කාර්යය බාරය<br>අම්පාර පලමුවන මාවත කාන්තා ග්‍රාම සංවර්දන සමිති සාමාජිකයින් | ප්‍රගීත් ලසන්ත මුණසිංහ<br>ස්ථානභාර නිළධාරි | 48 |
| 11. | 2023.06.17 | ශිෂ්‍යනායක පුහුණු වැඩසටහන<br>වැරැන්කැටගොඩ මහ විද්‍යාලය | ප්‍රගීත් ලසන්ත මුණසිංහ<br>ස්ථානභාර නිළධාරි | 72 |
| 12. | 2023.08.19 | ශිෂ්‍යනායක පුහුණු වැඩසටහන<br>කෙත්සිරිගම මහ විද්‍යාලය | ප්‍රගීත් ලසන්ත මුණසිංහ<br>ස්ථානභාර නිළධාරි | 61 |
| 13. | 2023.12.01 | ශිෂ්‍ය නායක පුහුණු වැඩසටහන<br>අම්පාර කාවන්තිස්ස මහ විදයාලය | ප්‍රගීත් ලසන්ත මුණසිංහ<br>ස්ථානභාර නිළධාරි | 57 |
| 14. | 2023.11.20 | මනෝ සමාජී නිපුණතා සංවර්දනය<br>දිස්ත්‍රික් කාන්තා බල මණ්ඩල නිළධාරිනියන් | ප්‍රගීත් ලස්නත මුණසිංහ<br>ස්ථානභාර නිළධාරි | 45 |
| 15. | 2023.03.08 | ලෝක කාන්තා දින සැමරුම් වැඩසටහන - අම්පාර ජොෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලය | ප්‍රගීත් ලස්නත මුණසිංහ<br>ස්ථානභාර නිළධාරි | 89 |
| 16. | 2023.10.19 | නවයොවුන් විය අභියෝග ජය ගැනිම<br>මහඔය කැප්පෙටිපොල ජාතික පාසල | විශේෂඥ මනෝ වෛද්‍ය සමිර රුවන්ප්‍රිය මහතා.<br>මනෝ වෛද්‍ය සමාජ වැඩ නිළධාරි හසිත ප්‍රියංකර මහතා<br>ප්‍රගීත් ලස්නත මුණසිංහ<br>ස්ථානභාර නිළධාරි | 118 |
| 17. | 2023.08.17 | නවයොවුන් විය අභියෝග ජය ගැනිම<br>ගෝනගල මහ විද්‍යාලය | විශේෂඥ මනෝ වෛද්‍ය සමිර රුවන්ප්‍රිය මහතා.<br>මනෝ වෛද්‍ය සමාජ වැඩ නිළධාරි හසිත ප්‍රියංකර මහතා<br>ප්‍රගීත් ලස්නත මුණසිංහ<br>ස්ථානභාර නිළධාරි | 87 |

| | | | | |
|---|---|---|---|---|
| 18. | 2023.05.17 | පාසල් උපදේශන ගුරුවරුන්ගේ ධාරිතා සංවර්දනය කිරිම<br>අම්පාර අධ්‍යාපන කලාපය | විශේෂඥ මනෝ වෛද්‍ය සමීර රුවන්ප්‍රිය මහතා.<br>ප්‍රගීත් ලස්නත මුණසිංහ ස්ථානභාර නිළධාරි | 31 |
| 19. | 2023.05.23 | පාසල් උපදේශන ගුරුවරුන්ගේ ධාරිතා සංවර්දනය කිරිම<br>දමන අධ්‍යාපන කලාපය | ප්‍රගීත් ලස්නත මුණසිංහ ස්ථානභාර නිළධාරි | 40 |
| 20. | 2023.08.16 | පාසල් උපදේශන ගුරුවරුන්ගේ ධාරිතා සංවර්දනය කිරිම<br>රිදිමාලියද්ද අධ්‍යාපන කලාපය | ප්‍රගීත් ලස්නත මුණසිංහ ස්ථානභාර නිළධාරි | 77 |
| 21. | 2023.12.27 | කාර්යමණ්ඩල ධාරිතා සංවර්දන වැඩසටහන<br>අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ප්‍රගීත් ලස්නත මුණසිංහ ස්ථානභාර නිළධාරි | 62 |
| 22. | 2023.06.14 | ආතති කළමණාකරනය<br>සිවිල් ආරක්ෂක බලකා මුලස්ථානය - රජගලතැන්න | ප්‍රගීත් ලස්නත මුණසිංහ ස්ථානභාර නිළධාරි | 86 |
| **මුලු ප්‍රතිලාභීන් ගණන** | | | | **1,361** |

**<u>උපදේශන මධ්‍යස්ථානය මගින් මනෝවිද්‍යා උපදේශන සේවාවන් සැපයීම.</u>**

ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක මනෝ විද්‍යා උපදේශන මද්‍යස්ථානය මගින් 2023 වර්ෂයේ සේවාලාභින් 43 දෙනෙකු හට උපදේශන සේවාවන් ලබාදෙන ලදි.

| **විස්තරය** | **සේවාලාභීන් සංඛ්‍යාව** |
|---|---|
| අධ්‍යාපන බාධා/ළමුන් ගේ හැසිරීම් ගැටළු | 14 |
| පවුල් ආරවුල් | 09 |
| මානසික රෝගාබාධ | 06 |
| ආර්ථික ගැටළු ආශ්‍රිත | 07 |
| වෙනත් | 07 |

සියදිවි නසාගැනිමේ සිතුවිලි සහිත සේවාලාභින් 06 දෙනෙක් ද මේ අතර විය.

සේවාලාභින් යොමු කිරීම්

01. අම්පාර මහරෝහලේ මානසික සුවතා ඒකකය
02. ප්‍රාදේශිය රෝහල්
03. පොලිස්ථාන
04. අම්පාර දිසා අධිකරණය
05. ප්‍රාදේශීය ලේකම් කාර්යාල
06. ස්වේච්ඡා ඉදිරිපත්වීම්

## සමාජවැඩ පුහුණු, පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය, තලාව



### හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ තලාව ප්‍රාදේශිය පුහුණු කිරිමේ මධ්‍යස්ථානය උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාෂයේ, මොරගොඩ ග්‍රාමසේවා කොට්ඨාශයේ පිහිටා ඇත. අනුරාධපුර කුරුණෑගල ප්‍රධාන මාර්ගයට මුහුණලා තලාව නගරයේ සිට කි.මී. 2 පමණ අනුරාධපුර නගරයට වන්නට පිහිටා ඇත.

වර්තමානය වන විට තලාව ප්‍රාදේශිය පුහුණු කිරිමේ මධ්‍යස්ථානය සතුව අක්කර 05 ආසන්න භූමියක් සතු වන අතර දෙමහල් ගොඩනැගිල්ලකින් සමන්විත වේ. ප්‍රධාන ගොඩනැගිල්ලේ පහල මහලේ කාර්යාල කාමර 05 ක් හා කුඩා නේවාසික කාමර 02 ක් තට්ටු ඇඳන් 35 ක් සහිත වෙන් කරන ලද කාමර 02 කින් හා භොජනාගාරයකින් සමන්විත වේ. ඉහළ මහලේ කුඩා නේවාසික කාමර 02 ක් හා VIP කාමර 01 දේශන ශාලාවකින් යුක්ත වේ.

### ආරම්භය

අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා සමාජ සේවා අමාත්‍ය ගරු බර්ට් ප්‍රේමලාල් දිසානායක මැතිතුමන්ගේ යෝජනාවක් අනුව බණ්ඩාරනායක ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා වන මෙම ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීමේ කටයුතු එතුමාගේ ආරාධනයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ගරු කථානායක ආචාර්ය කේ.බී. රත්නායක මැතිතුමගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිනි අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරණායක කුමාරතුංග මැතිනිය විසින් වර්ෂ 1999ක් වූ පෙබරවාරි මස 26 වෙනි දිනට යෙදුන සුභ මොහොතින් මුල්ගල තබා ආරම්භ කරන ලදී.

**ආරම්භ කිරීමේ අරමුණු**

2002 මාර්තු මස 31 වන දින සමාජ සුභසාධන අමාත්‍ය ගරු රවින්ද්‍ර සමරවීර මැතිතුමා අතින් විවෘත කරන ලදී. මෙම තලාව මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණ වුයේ සමජ වැඩ අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණ අංශයෙහි වැඩ මෙම මධ්‍යස්ථානය හරහා ප්‍රදේශයට ලබාදීම සඳහාත් සියලුම දෙනාගේ ජීවන තත්වය ගුණාත්මක මට්ටමින් වර්ධනය කිරීමෙහිලාත් ප්‍රාදේශීය මට්ටමින් සහය ලබාදීම සඳහාත්ය.

**ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ දැක්ම**

සමාජ වැඩ අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණ අංශයෙහි දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විශිෂ්ඨ කේන්ද්‍රස්ථානයේ ශාඛාවක් ලෙස සියලුම දෙනාගේ ජීවන තත්වයන්හි ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා සක්‍රිය කොටස් කරුවෙකු වීම.

**නේවාසික මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ තලාව ප්‍රාදේශිය පුහුණු කිරිමේ මධ්‍යස්ථානය නේවාසික මධ්‍යස්ථානයක් ලෙසද භාවිතා කරනු ලබයි. ප්‍රධාන ගොඩනැගිල්ට අදාලව VIP කාමර 01 (වායු සමනය කළ ) සහ කුඩා කාමර 3 ( ඇඳන් 03 බැගින්) ඇත. මීට අමතරව 36 දෙනෙකුට නේවාසික පහසුකම් සපයා දිමට හැකිය. මීට අමතරව ප්‍රධාන දේශන ශාලාව (අඩි 60x30) ප්‍රමාණයේ ආසන 80ක් පමණ ඇත.

ආයතනය විසින් නියම කරන ලද මිල ගණන් යටතේ රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශය සඳහා පුහුණු වැඩසටහන් සඳහා මෙන්ම නේවාසික අවශ්‍යතා සඳහා මධ්‍යස්ථානයේ නේවාසිකාගාර භාවිතා කරනු ලබයි. මේ තුළින් ආයතනයට අමතර ආදායමක් මෙන්ම ජාතික මට්ටමෙන් විශාල සේවයක් සිදු කරනු ලබයි. එමෙන්ම ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ක්ෂේත්‍ර ගත සිසුන්ගේ නේවාසික කටයුතු සඳහා මෙන්ම ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා, පුහුණු වැඩ සටහන් සඳහා නේවාසික කටයුතු ලබාදිය හැකි ආයතනය සතු එකම මධ්‍යස්ථානය වන්නේ තලාව ප්‍රදේශීය ඉගනුම් මධ්‍යස්ථානයයි. තවද ආයතනය මගින් පවත්වන ඩිප්ලෝමා පාඨමාලා, උසස් ඩිප්ලෝමා පාඨමාලා සඳහා දුර බැහැර සිට පැමිණෙන සිසුන් සඳහා නේවාසික පහසුකම් ලබා දිම තුළින් සිසුන් හට මහත් පිටුවහලක් ලැබෙන අතර සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහාද මහත් සම්පතක් බවට ප්‍රාදේශිය මධ්‍යස්ථානය පත්ව ඇත.

## 01. කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර

| අංකය | තනතුර | නිළධාරින් ප්‍රමාණය |
|---|---|---|
| 01 | වැඩසටහන් සහකාර ස්ථානභාර | 01 |
| 02 | කළමනාකරන සහකාර | 02 |
| 03 | කාර්යාල කාර්ය සහයක | 01 |
| 04 | රාත්‍රී මුරකරු ,පෞද්ගලික ආරක්ෂක අංශයෙන් යොදවා ඇත. | 01 |

## 2023 වර්ෂයේ තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ වියදම් වාර්තාව

| මාසය | ජලය (රු.) | විදුලිය (රු.) | දුරකථන (රු.) | අත්තිකාරම් (රු.) | මුළු වියදම (රු.) |
|---|---|---|---|---|---|
| ජනවාරි | 3,744.40 | 4,356.00 | 2,177.00 | 4,660.00 | |
| පෙබරවාරි | 2,136.70 | 9,485.00 | 2,016.00 | | |
| මාර්තු | 2,231.00 | 16,007.00 | 2,016.00 | | |
| අප්‍රේල් | 3,325.03 | 11,715.00 | 2,016.00 | | |
| මැයි | 4,236.98 | 14,713.00 | 2,127.00 | 8,390.00 | |
| ජුනි | 8,662.57 | 11,294.00 | 2,353.31 | 6,610.00 | |
| ජුලි | 3,838.70 | 9,195.00 | 2,016.49 | | |
| අගෝස්තු | 5,065.38 | | 2,016.49 | 10,010.00 | |
| සැප්තැම්බර් | 7,216.25 | 5,712.82 | 2,016.49 | 20,000.00 | |
| ඔක්තෝබර් | 5,543.00 | 13,307.69 | 2,016.49 | 15,590.00 | |
| නොවැම්බර් | 6,205.00 | 10,650.00 | 2,016.00 | 18,325.00 | |
| දෙසැම්බර් | 2,852.00 | 8,751.79 | 2,016.00 | 19,225.00 | |
| **එකතුව** | **33,237.00** | **71,365.00** | **16,737.00** | **104,810.00** | **226,149.00** |

## 2023 තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානය පාඨමාලා තුලින් ලැබූ වාර්ෂික ආදයම

| අනු අංකය | පාඨමාලාව | අයකරන ලද ගාස්තුව (රු.) | සිසුන් ගණන | මුදල් (රු.) |
|---|---|---|---|---|
| 01 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 60,000.00 | 48 | 2,820,000.00 |

## 2023 තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානය ලැබූ වාර්ෂික අමතර ආදයම

| මාසය | මුදලින් | | නොමිලේ | |
|---|---|---|---|---|
| | දේශනශාලා | නේවාසිකවීම් | දේශනශාලා | නේවාසිකවීම් |
| ජනවාරි | | | 8,000.00 | 1,000.00 |
| පෙබරවාරි | | 7,800.00 | 8,000.00 | 1,000.00 |
| මාර්තු | | 700.00 | 8,000.00 | 1,000.00 |
| අප්‍රේල් | | 13,250.00 | 8,000.00 | 1,000.00 |
| මැයි | | 10,750.00 | 8,000.00 | 1,000.00 |
| ජුනි | | 16,250.00 | 8,000.00 | 1,000.00 |
| ජුලි | | 6,000.00 | 8,000.00 | 1,000.00 |
| අගෝස්තු | 6,000.00 | 700.00 | 8,000.00 | 1,000.00 |
| සැප්තැම්බර් | | 700.00 | 8,000.00 | 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| ඔක්තෝබර් | 6,000.00 | 29,300.00 | 8,000.00 | - |
| නොවැම්බර් | | 1,050.00 | 8,000.00 | 1,000.00 |
| දෙසැම්බර් | | 14,200.00 | 8,000.00 | 1,000.00 |
| **එකතුව** | **12,000.00** | **100,700.00** | **96,000.00** | **11,000.00** |

**තලාව මධ්‍යස්ථානයේ 2023 වර්ෂයේ නොමිලේ පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන් විස්තර**

| කෙටි පුහුණු වැඩසටහන් | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|
| ඉගනුම් අක්‍රමතා හදුනාගැනීම සහ සිසුන්ගේ දෙමාපියන්ගේ මානසික සුව තාවය සංවර්ධනය-දුනුමඩලාව විද්‍යාලය-නොච්චියාගම | 25 |
| විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ දෙමාපියන් සඳහා ආතති කළමනාකරණය සදහා පවත්වනු ලැබූ වැඩසටහන ගිරිබාව-විශේෂ අවශ්‍යතා සහිත නිපුණතා සංවර්ධන මධ්‍යස්ථානය | 35 |
| ආයතනගත දරුවන් සඳහා අධ්‍යාපන උපදේශනය SOS-ගම්මානය | 40 |
| නිකවැරටිය මොන්නැකුළම මහා විද්‍යාලයේ ගුරුවරුන් සහ ශිෂ්‍යයින් සඳහා පැවැති ධාරිතා සංවර්ධන වැඩසටහන | ගුරුවරුන් 25<br>ශිෂ්‍යයින් 80 |
| ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මධ්‍යම පළාත් නිලධාරීන් සඳහා සමාජ වැඩ මැදිහත්කරණය පිළිබඳ දෙදින කෙටි පුහුණු වැඩසටහන | 50 |

# සමාජවැඩ පුහුණු, පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය, කිලිනොච්චිය




### හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ කිලිනොච්චි ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය කිලිනොච්චි පැරණි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටා ඇත. එය A9 මාර්ගයට ආසන්නව පිහිටා ඇත. එය දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටා ඇත. ප්‍රධාන ගොඩනැගිල්ලේ කාර්යාලයක්, පන්ති කාමර දෙකක් සහ කුඩා නේවාසිකාගාරයක් ඇත.

### ආයතනයේ කාර්ය මණ්ඩලය

| අනු අංකය | නිලධාරියාගේ තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ස්ථානභාර නිලධාරී | 01 |
| 02 | කළමනාකරණ සහකාර | 01 |
| 03 | කාර්යාල සහායක | 01 |

### 2023 කිලිනොච්චිය ප්‍රාදේශීය මධ්‍යස්ථානය ලැබූ වාර්ෂික අමතර ආදයම

| අනු අංකය | පාඨමාලාව | අයකරන ලද ගාස්තුව (රු.) | සිසුන් ගණන | මුදල් (රු.) |
|---|---|---|---|---|
| 01 | ළමා කේන්ද්‍රීය ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව ( දෙමළ මාධ්‍ය) | 11,000.00 | 19 | 209,000.00 |

**කිලිනොච්චිය මධ්‍යස්ථානයේ 2023 වර්ෂයේ නොමිලේ පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන් විස්තර**

| අනු අංකය | පාඨමාලාව | මධ්‍යස්ථානය | වැඩසටහන් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | සමෘද්ධිලාභීන් සඳහා දැනට පවතින ව්‍යසන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන. | වඩමරාච්චි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. | 01 | 40 |
| 02 | කණ්ඩායම් උපදේශන වැඩසටහන | කිලිනොච්චි පුහුණු මධ්‍යස්ථානය, ජාතික සමාජ සංවර්ධන ආයතනය | 03 | 45 |
| 03 | මත්ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | කිලිනොච්චි පුහුණු මධ්‍යස්ථානය, ජාතික සමාජ සංවර්ධන ආයතනය | 03 | 28 |

## 2.4 සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය

### 2023 වර්ෂයේ ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය

| අනු අංකය | ව්‍යාපෘති වැඩසටහන | ආරම්භක දිනය | නිම කළ දිනය | ක්‍රියාකාරකම | වැඩසටහනේ ප්‍රගතිය 01.01.2023-31.12.2023 | මූල්‍ය ප්‍රගතිය (රු.) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | මුළු මුදල | වියදම් | ශේෂය |
| 01 | ජර්නල් 7ක් සහ පුවත් හසුන් 2ක් මාර්ගගතව ප්‍රකාශයට පත් කිරීම | 01.01.2023 | 30.12.2023 | සමාජ විද්‍යා සඟරාව ප්‍රකාශයට පත් කිරීම (Peer Reviewed Journal) | සාර්ථකව නිම කරන ලදී | 100,000.00 | 107,500.00 | (7,500.00) |
| 02 | සමාජ වැඩ පිළිබඳ 2 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය "සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රජාව සවිබල ගැන්වීමේ සමාජ සේවකයාගේ කාර්යභාරය" | 01.01.2023 | 30.12.2023 | වැඩසයහන සංවිධානය කිරීම, මාර්ගෝපදේශ සකස් කිරීම, පර්යේෂණ පත්‍රිකා කැඳවීම<br>ලිපි සමාලෝචනය කිරීම<br>සම්මන්ත්‍රණය පැවැත්වීම | සාර්ථකව නිම කරන ලදී | 50,000.00 | 50,000.00 | 0 |
| 03 | කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන | 13.01.2023 | 30.12.2023 | අධ්‍යයන නිලධාරින් 04 දෙනෙකු කැළණි විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩල වැඩසටහනට සහභාගි විය. | සාර්ථකව නිම කරන ලදී | 300,000.00 | 250,000.00 | 50,000.00 |
| 04 | කාන්තා සවිබල ගැන්වීමේ ඩිප්ලෝමා පාඨමාලාව | 01.01.2023 | 30.12.2023 | විෂයමාලා සමාලෝචන රැස්වීමක් පැවැත්වීම | සමාලෝචනය සඳහා විෂයමාලා සමාලෝචන කමිටුවට ඉදිරිපත් කරන ලදී. | අංශය මඟින් | | |
| 05 | සමාජ වැඩ පර්යේෂණ ක්‍රම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 01.01.2023 | 30.12.2023 | විෂයමාලා සමාලෝචන රැස්වීමක් පැවැත්වීම | සමාලෝචනය සඳහා විෂයමාලා සමාලෝචන කමිටුවට ඉදිරිපත් කරන ලදී. | අංශය මඟින් | | |

| අනු අංකය | ව්‍යාපෘති වැඩසටහන | ආරම්භක දිනය | නිම කළ දිනය | ක්‍රියාකාරකම | වැඩසටහනේ ප්‍රගතිය **01.01.2023-31.12.2023** | මූල්‍ය ප්‍රගතිය (රු.) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | මුළු මුදල | වියදම් | ශේෂය |
| 06 | සමාජ සංවර්ධනය පිළිබඳ ශාස්ත%වේදී උපාධිය සඳහා විෂයමාලා සංවර්ධනය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීම | 01.01.2023 | 31.12.2023 | ශක්‍යතා අධ්‍යයනය පැවැත්වීම | යෝජනා පත්‍රය සකස් කිරීම හා මෙවලම් සකස් කිරීම | 200,000.00 | වියදම් සිදු කර නැත | 200,000.00 |
| 07 | තත්ත්ව සහතික වැඩසටහනට සම්බන්ධ වීම | 01.07.2023 | 30.12.2023 | ක්‍රියාකාරකම් වලට සම්බන්ධවීම | ශාස්ත්‍රීය පර්යේෂණ හා වෙනත් ලියකියවිලි | අංශය මඟින් | | |
| 08 | පොත් එළිදැක්වීම සහ බුද්ධිමය කතිකාවත | 01.07.2023 | 31.12.2023 | බුද්ධිමය කතිකාවත | සාර්ථකව නිම කරන ලදී | 50,000.00 | වියදම් සිදු කර නැත | 50,000.00 |
| | **එකතුව** | | | | | **700,000.00** | **407,500.00** | **292,500.00** |

## සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය

**අංශයේ අරමුණ**

සමාජ වැඩ, සමාජ සුබසාධන හා සමාජ සංවර්ධන විෂය ක්ෂේත්‍රය හා අදාළ විවිධ පර්යේෂණ හා අධ්‍යයන සිදු කිරීමත්, ඒ ආශ්‍රිත පර්යේෂණ වාර්තා හා ශාස්ත්‍රීය සංග්‍රහ ප්‍රකාශයට පත් කිරීමත්, පුළුල් වශයෙන් ශ්‍රී ලංකාවේ සමාජ සුබසාධන හා සංවර්ධන විෂය ක්ෂේත්‍රයට අදාළ සමාජ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දායකත්වය ලබා දීම සඳහා කටයුතු කිරීම.

**පර්යේෂණ අංශයේ කාර්යභාරය**


- සමාජ පර්යේෂණ හා සමීක්ෂණ ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම හා සමාජ වැඩ හා සමාජ ප්‍රතිපත්තීන් සම්පාදනයට අවශය සැලසුම් සකස් කිරීම.
- සමාජ පර්යේෂණවල නිරත වෙමින් පවතින සමාජ ගැටලු කෙරෙහි අවධානය යොමු කරමින් රාජය ප්‍රතිපත්ති හා විවිධ ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම.
- අදාළ අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය ඇති කරමින් වරප්‍රසාධ අභිමි පවුල් සඳහා අවශ්‍ය වන පහසුකම් හා සේවා ලබා ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා දීම.
- රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, සංවිධාන සමඟ ඒකාබද්ධ වී පර්යේෂණ දියත් කිරීම ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රමවේදයන් මඟින් පර්යේෂණයන් සිදු කිරීම.
- පර්යේෂණ යෝජනා පත්‍ර සකස් කිරීම, ඉදිරිපත් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම හා පර්යේෂණ වාර්තා සකස් කිරීම.
- ක්ෂේත්‍රයට ගොස් තොරතුරු එකතු කිරීම හා ඒවායේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම.
- සමාජ පර්යේෂණවලට අදාළ දත්ත බැංකුවක් පවත්වා ගෙන යාම.

**පර්යේෂණ අංශය මඟින් ප්‍රකාශයට පත්කරනු ලබන ශාස්ත්‍රීය ප්‍රකාශන**

**ශ්‍රී ලංකා සමාජ වැඩ සගරාව (Sri Lanka Journal of Social Work)**


සමාජ වැඩ විෂය මෙරට තුළ තවමත් ජනප්‍රිය විෂයක් නොවුණ ද වර්තමානය වන විට මෙම විෂයේ අවශ්‍යතාවය මතු වෙමින් පවතී. එබැවින් සමාජ වැඩ විෂයිය දැනුම සමාජගත විද්‍යාර්ථයින් තුළ වර්ධනය කිරීම සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය මඟින් අර්ධ වාර්ෂිකව ශ්‍රී ලංකා සමාජ වැඩ සඟරාව ප්‍රකාශයට පත් කරනු ලබයි. මෙම සඟරාව මඟින් සමාජ වැඩ පර්යේෂණ හා ශාස්ත්‍රීයකරණයේ නිරත පර්යේෂකයන්ට හා විද්‍යාර්ථයින්ට ඔවුන් රුචිකත්වයක් දක්වන පර්යේෂණ හා ශාස්ත්‍රීය විෂය කේෂ්ත්‍රය අවශ්‍ය නවාංගයන් හඳුන්වා දීමට මෙන්ම සමාජ වැඩ විෂයෙහි ප්‍රගමනය උදෙසා මාර්ගෝපදේශන සපයාදීමක් සිදු කරයි.

2023 වර්ෂයේ ප්‍රකාශයට පත් කරන ලද මෙම සඟරාවේ මූලික තේමාව වූයේ **"සමාජ වැඩ අධ්‍යාපනයේ නව ප්‍රවණතා"** (*New tendencies in Social Work Education*) වේ. භාෂා ත්‍රිත්වයෙන්ම සමාජ වැඩ පර්යේෂණාත්මක පත්‍රිකා අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ලැබේ. ශ්‍රී ලංකා සමාජ වැඩ සඟරාව සංගෘහිත විමර්ශිත ජර්නලයක් (Peer Reviewed) ලෙස ප්‍රකාශයට පත් වන අතර මෙම ප්‍රකාශනය අන්තර් ජාතික ජර්නල් ප්‍රමිතියට අනුව සම්පාදනය කර ඇත. සමාජ වැඩ විෂය කේෂ්ත්‍රයට අදාළ විෂය ප්‍රාමාණික විමර්ශිත මණ්ඩලයක් මඟින් සෑම පර්යේෂණ පත්‍රිකාවක්ම ද්විත්ව විමර්ශනයට ලක් කරයි.




### ශ්‍රී ලංකා සමාජ සංවර්ධන සඟරාව (Sri Lanka Journal of Social Development)


ජාතික සමාජ සංවර්ධන ආයතනයේ මෙහෙයවීම හා මූලිකත්වය යටතේ සමකාලීන සමාජ ගැටලු ඉලක්ක කර ගනිමින් පර්යේෂණ රැසක් ක්‍රියාත්මක කර ඇත. සමකාලීන සමාජය තුළ පර්යේෂණ ක්‍රියාත්මක කළ ද ඒවා නිසි ආකාරයට සමාජගත වීමක් සිදුනොවේ. එකී අධ්‍යයන හිඩැස පූරණය කරමින් ජාතික සමාජ සංවර්ධන ආයතනය පර්යේෂණ සාහිත්‍ය සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා සමාජ සංවර්ධන සඟරාව ප්‍රකාශයට පත් කරනු ලබයි. ශ්‍රී ලංකා සමාජ සංවර්ධන සඟරාව 2023 වර්ෂය සඳහා **Psycho - Social Intervention for Women Development** යන තේමාව යටතේ අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ලදී. ශාස්ත්‍රීය සවිඥානිකත්වය ඇතිකරලීම සහ ඔවුනොවුන් එක් එක් විෂය මූලිකව සුවිශේෂායනය වී ඇති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ගොඩනගාගත් දැනුම හුවමාරු කර ගැනීම මඟින් ශ්‍රී ලාංකේය සමාජ සන්දර්භයෙහි බහු ශික්ෂණික ශාස්ත්‍රීය කතිකාවක් ගොඩනැංවීමට අවශ්‍ය කාර්යභාරය සකස් කිරීම සිදු වේ. මෙම ශාස්ත්‍රීය ප්‍රකාශනය පොදුවේ ශාස්ත්‍රීයකරණයේ නියුක්තවූවන්ට දැනුම වර්ධනය කරලීම උදෙසා හේතු වී ඇත. සංස්කෘතික විමර්ශිත ජර්නලයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකා සමාජ සංවර්ධන ජර්නලය අන්තර් ජාතික ජර්නල් ප්‍රමිතියට අනුව සම්පාදනය කර ඇති සාමාජීය විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රාමාණික විමර්ශිත මණ්ඩලයක් මඟින් සෑම පර්යේෂණ පත්‍රිකාවක්ම ද්විත්ව විමර්ශනයට ලක් කර ඇත.



## විද්‍යුත්සඟරාව (E-Journal of Social Work)

අර්ධ වාර්ෂික සමාජ වැඩ විද්‍යුත් සඟරාව Respecting diversity through joint social action යන තේමාව යටතේ ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය පදනම් කර ගනිමින් ශාස්ත්‍රීය හා පර්යේෂණ ලිපි ප්‍රකාශයට පත්කර ඇත. තත්කාලීන ලාංකේය සමාජයේ ගැටලුවලට සමාජ වැඩ මැදිහත්කරණ ශිල්පීය ක්‍රම භාවිතයෙන් ඉදිරිපත් කිරීම මෙන්ම සමාජ වැඩ විෂය තුළ නවමානයක් ඇති කිරීම මෙමගින් සිදුවේ. එමෙන්ම නවීන තාක්‍ෂණය භාවිතයෙන් එවැනි කරුණු සම්බන්ධව ගෝලීයව කතිකාවතක් නිර්මාණය කිරීම ද අරමුණු කර ඇත. මෙම විද්‍යුත් සඟරාව මඟින් සමාජ ගැටලු පිළිබඳ තොරතුරු සැපයීම හා එමඟින් සමාජ වැඩ අධ්‍යාපනය පුළුල් කිරීමට අවශ්‍ය දැනුම ව්‍යාප්ත කිරීමට කටයුතු කරනු ඇත.

ශ්‍රී ලංකා සමාජ වැඩ විද්‍යුත් සඟරාව සංගෘහිත විමර්ශිත ජර්නලයක් (Peer Reviewed) ලෙස අන්තර් ජාතික ජර්නල් ප්‍රමිතියට අනුව සම්පාදනය කර ඇත. සමාජ වැඩ විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රාමාණික විමර්ශිත මණ්ඩලයක් මඟින් සෑම පර්යේෂණ පත්‍රිකාවක්ම ද්විත්ව විමර්ශනයට ලක් කර ඇත.




## සමාජ වැඩ ශිෂ්‍ය සඟරාව (Student Journal of Social Work)

සමාජ වැඩ ශිෂ්‍ය සඟරාව 2023 වර්ෂය සඳහා සමාජ වැඩ ක්ෂේත්‍රයේ විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ ශාස්ත්‍රීය කතිකාවතක් ගොඩනැගීම සඳහා සමාජ වැඩ උපාධි අපේක්ෂිකයින්ගේ ශාස්ත්‍රීය ලිපි ප්‍රකාශයට පත්කෙරේ. වාර්ෂික සමාජ වැඩ ශිෂ්‍ය සඟරාව, ප්‍රජා සංවර්ධනය සඳහා සමාජ වැඩ මැදිහත්වීම යන තේමාව යටතේ ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය පදනම් කර ගනිමින් ශාස්ත්‍රීය හා පර්යේෂණ ලිපි ප්‍රකාශයට පත්කර ඇත. ශාස්ත්‍රීය කුසලතාව ඇති කිරීම සඳහා ඔවුනොවුන්ගේ එක් එක් විෂය මූලිකව සුවිශේෂායනය වී ඇති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ගොඩනගාගත් දැනුම හුවමාරු කර ගැනීම මඟින් ශ්‍රී ලාංකීය සමාජ සන්දර්භයේ සමාජ වැඩ දැනුම සමාජගත කිරීම අරමුණුගතව සම්පාදිත මෙම ශාස්ත්‍රීය ප්‍රකාශනය ජාතික සමාජ සංවර්ධන ආයතනය මඟින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කෙරේ.




## පුවත්හසුන (Newsletter)

ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් වාර්ෂිකව පුවත් හසුන ප්‍රකාශයට පත් කරනු ලබයි. ජාතික සමාජ සංවර්ධන ආයතනය පිළිබඳ 2023 වර්ෂයට අදාළ ප්‍රකාශ හා ඉගෙනුම්ගත අධ්‍යාපනික විස්තර ඇතුළත්ව මෙම ප්‍රකාශනය සකස් වී ඇත. පුවත් හසුන තුළ ආයතනයේ සමාජ සේවා විද්‍යාලය, පුහුණු අංශය හා පර්යේෂණ හා ප්‍රකාශන යන අධ්‍යයන අංශයන් ත්‍රිත්වයේ හා පාලන හා මුදල් යන ආයතනික අංශවල වර්තමාන තොරතුරු කේන්ද්‍ර කර ගනිමින් ප්‍රකාශයට පත්කර ඇත. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන, පර්යේෂණ හා පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම පුවත් හසුනේ ප්‍රධාන අරමුණු වේ.



## කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධනය වැඩසටහන -2023

පර්යේෂණ හා ප්‍රකාශන අංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. මෙම ඉලක්කගත ක්ෂේත්‍ර පෙරදැරි කරගනිමින් පර්යේෂණ හා ප්‍රකාශන අංශයේ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 05ක් කැළණිය විශ්වවිද්‍යාලව මගින් පැවැත්වූ කාර්ය මණ්ඩල වැඩසටහන සඳහා සහභාගි විය.

කැලණිය විශ්වවිද්‍යාලය මගින් සිදුකරනු ලැබූ කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහනෙහි මෙහෙවර වන්නේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන පද්ධතිය තුළ කාර්ය මණ්ඩලයේ පුද්ගල සහ ආයතනික හැකියාවන් ඉහළ නංවන අධ්‍යයන හා පරිපාලන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා සහාය වීමයි. කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහනක් ලබා දීමෙන් විශ්වවිද්‍යාල පද්ධතිය හා වෘත්තීය අධ්‍යයන පරිසරයක් තුළ ඵලදායී ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය කුසලතා සහ නිපුණතා වර්ධනය කිරීමට සහාය වීමක් සිදුවේ. එම අධ්‍යයන/පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉගැන්වීම්හි ඇගයීම්, පර්යේෂණ සහ විෂයමාලා සංවර්ධනය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිතය, පරිපාලනය සහ කළමනාකරණය යන ක්ෂේත්‍රවල නිපුණතා වැඩිදියුණු කිරීම මෙහි අරමුණු වේ.

## සමාජ වැඩ පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සැසිය 2023

සමාජ වැඩ පිළිබඳ 2 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICSW-2023) හි තේමාව වන්නේ "සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රජා සවිබල ගැන්වීමේ සමාජ වැඩ මැදිහත්වීම". මෙම සන්දර්භය තුළ, මෑත කාලීන සමාජ ආර්ථික අර්බුද උත්සන්න වීම වැනි ගෝලීය බලපෑම් සහිත තත්ත්වයන් සහ සිදුවීම් නිසා ඇති වන අනෙකුත් සමාජ-ආර්ථික කැළඹීම් මතු වන විට, සමාජ වැඩවලට අර්බුද මැදිහත්වීමේ යාන්ත්‍රණයන් සක්‍රීය කිරීමටත්, එයට සහාය වීම සඳහා එහි උපාය මාර්ග නැවත සිතා බැලීමටත් සිදුවී ඇත. සමාජ වැඩ, එහි ඔරොත්තු දීමේ හැකියාව සහ නවෝත්පාදන හැකියාව හරහා, පශ්චාත් වසංගත සහ අනෙකුත් පුළුල් සංසිද්ධිවල මනෝ-සමාජ-ආර්ථික ප්‍රතිවිපාක අඩු කිරීමට පමණක් නොව වඩා හොඳ සහ වඩා සාධාරණ ලෝකයක් හැඩගැස්වීමට දායක විය හැකිය.

ICSW-2023, ගතික සහ අනුවර්තනය පිළිබඳ ආවර්ජනය කිරීමට අප හා සම්බන්ධ වීමට වෘත්තීයමය වශයෙන් ක්‍රියාශීලී හෝ සමාජ වැඩ හෝ ආශ්‍රිත අර්බුද මැදිහත්වීම් හෝ සමාජ විද්‍යා ක්ෂේත්‍රයන්හි අධ්‍යයන උනන්දුවක් ඇති සමාජ වැඩ සිසුන්, කථිකාචාර්යවරුන් සහ වෘත්තිකයන් සඳහා වඩාත් උනන්දුවක් දක්වනු ඇත. ලෝක ව්‍යාප්ත බලපෑම් සහිත මෑත කාලීන අභියෝගවලින් සමාජ වැඩ සඳහා උගත් පාඩම් මොනවාද? මෙම අභියෝගවලට මුහුණ දීමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රායෝගිකව, පර්යේෂණ සහ/හෝ සමාජ වැඩ අධ්‍යාපනය සඳහා ක්‍රියාත්මක වූ හෝ අවශ්‍ය වූ නව්‍ය ප්‍රවේශයන් මොනවාද? වැඩිදියුණු කළ සමාජ ආරක්ෂණ උපාය මාර්ග සඳහා සමාජ වැඩවල නවෝත්පාදන හැකියාවන් වඩා හොඳින් භාවිතා කිරීම සඳහා කළ යුත්තේ කුමක්ද? යන්න සොයා බැලීමයි.

**අරමුණ:** සමුළුවේ පරමාර්ථය වන්නේ සමාජ ආර්ථික සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන ගෝලීය වෘත්තියක් ලෙස සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රීය සංවාද පැවැත්වීමයි.

ප්‍රධාන දේශනය මහාචාර්ය. වෙන්කට් රාඕ පුල්ලා විසින් පවත්වන ලදී. ඔහු MAASW, (Accredited), MA, PhD, සමාජය සහ අධ්‍යාපන විද්‍යාලයේ අතිරේක සහකාර මහාචාර්ය, පදනමේ ශක්තීන්-පාදක-සමාජ වැඩ පුහුණුවීම් පිළිබඳ මහාචාර්යවරයා, බ්‍රිස්බේන් ශක්තීන් පදනම් කරගත් අභ්‍යාස ආරම්භක සාමාජික, ඕස්ට්‍රේලියානු

පර්යේෂකයන්ගේ සහ ජීවිත සාමාජික, ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ඕස්ට්‍රේලියානු ආයතනය යන තනතුරු දරයි. ඔහු පැවැත්වූ දේශනයේ සාරාංශය පහත සඳහන් කළ හැකිය.

පශ්චාත් වසංගත හා ආර්ථික බිඳවැටීම් යළි ගොඩනැගීමේ කේන්ද්‍රීයත්වය වන්නේ මිනිසුන්ගේ ශක්තිය සහ ඔරොත්තු දීමේ හැකියාවයි. නමුත් තීරණාත්මක. පාර්ශ්වකරුවන් යනු මිනිසුන්මය. ඔවුන් ඔවුන්ගේ ප්‍රකෘතියට සම්බන්ධ නොවන්නේ නම්, රජයන්ට සහ සංගතවලට භාර දීමේ ප්‍රවේශයක් තිබේ නම්, කිසිදු ප්‍රකෘතියක් ඇති නොවනු ඇත. ප්‍රත්‍යස්ථ පුද්ගලයන්ගෙන් සැදුම්ලත් ප්‍රජාවක් ඉක්මනින් හා ඵලදායී ලෙස වෙනස් වීමට අනුවර්තනය වීමට වඩා හොඳින් ස්ථානගත වනු ඇත, ප්‍රත්‍යස්ථ පුද්ගලයන්ගේ එකතුවක් සමස්ත ප්‍රජාවකට එහි පරිසරයේ අභියෝගවලට හොඳින් ප්‍රතිචාර දැක්වීමට හැකි වනු ඇතැයි සහතික නොවේ - පද්ධතියක් ඇත. සලකා බැලිය යුතු සමීකරණයට මූලද්‍රව්‍යය. ප්‍රාදේශීය සන්දර්භය හඳුනා ගැනීමට සහ ප්‍රජාවේ අනාගත දැක්ම බෙදා ගැනීමට ඇති හැකියාව, එක් අතකින්, ප්‍රජාව තුළ තම ස්ථානය තහවුරු කර ගැනීමට සහ බල ව්‍යුහයන් සමඟ වැඩ කිරීමට, අනෙක් පැත්තෙන්, ප්‍රජා සන්දර්භය තුළ සමාජ සේවකයින්ට අවශ්‍ය කුසලතා වේ. අවසාන ඉලක්කය වන්නේ ස්වයං නිර්ණයයි.

- ආන්තික ප්‍රජාවන් මුහුණ දෙන සමාජ සහ සෞඛ්‍ය අභියෝග
- කාන්තා සවිබල ගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ගැටළු
- අධ්‍යාපනය සහ තරුණ සංවර්ධනය
- මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම
- ප්‍රජා සංවර්ධනය සහ සමාජ වැඩ

මෙම සම්මන්ත්‍රණයේදී උප තේමා 5කට අදාළ පර්යේෂණ සාර සංක්ෂේප 52ක් ඉදිරිපත් කරන ලදී. එම උප තේමා පහක් පහත පරිදි වේ.

සැසිය 01: ආන්තික ප්‍රජාවන් මුහුණ දෙන සමාජ සහ සෞඛ්‍ය අභියෝග

සැසිය 02: කාන්තා සවිබල ගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ගැටළු

සැසිය 03: අධ්‍යාපනය සහ තරුණ සංවර්ධනය

සැසිය 04: මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම

සැසිය 05: ප්‍රජා සංවර්ධනය සහ සමාජ වැඩ

මෙම වැඩසටහන 118 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සාර්ථකව නිම කරන ලදී. එයට සාර්ක් රටවලින් 12 දෙනෙකු සහ ශ්‍රී ලංකාවෙන් 40 දෙනෙකු සහ සිසුන් 56 දෙනෙකු ඇතුළත් විය.


2nd INTERNATIONAL CONFERENCE ON SOCIAL WORK (ICSW - 2023)
Social Work Intervention in the Community Empowerment for Socio Economic Development
SUB THEMES
Adolescent and Youth Development
People with Disability
Gender Based Violence
Social Work for Health Care
Social Inequalities and Social Policies
Environmental and Sustainable Development
Social Work with Elderly People
Mental Health
Substance Use
Conference Date
12th October 2023
SPECIAL DATES
Deadline for the Abstract : 17 of July 2023
Conformation of the Abstract : 02 of August 2023
Paper Submission : 21 of August 2023
Registration : On or Before 12 of Sep. 2023
Conference Date : 12 of October 2023
Dr. Raveendra Kumara
Mr. M.B.M. Asmiyas
Mr. S. Hariharathamotharan
Mr. Keerthi Jayawardana
E-mail :- icosw@nisd.ac.lk
REGISTRATION FEE
Presenters
International Presenters : US$100
SAARC Presenters : US$ 50
International Students : US$ 25
Local Presenters : Rs. 2500.00
Students Presenters : Rs. 1500.00
Participants
International Participants : US$ 50
SAARC Participants : US$ 20
Local Participants : Rs. 2000.00
Students Participants : Rs. 1000.00
Organizing by
National Institute of Social Development
Social Development Policy, Research and Publication Division
(Ministry of Women, Child Affairs and Social Empowerment)

## 2.5 තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය

| මහජන බැංකුව | 3246001000147020 | | |
| මහජන බැංකුව | 3246001000158120 | | |
| රාසනායගම් - මහජන බැංකුව MSW | 143-6001-0000-2701-2 | 3,007 | 1,044 |
| ආර් ජයසිංහ (ඉමන්දි රොනාලි) | 143-6001-0000-2153-3 | 724 | 377 |
| TG & MG - මහජන බැංකු MSW | 143-6001-0000-2352-4 | 2,892 | 1,000 |
| | | **1,260,071** | **3,219,114** |

**උපලේඛනය - 05 ස්ථාවර තැන්පතු**

| | | 2023 | 2022 |
|---|---|---|---|
| එම්.එම්.එම්. නසීර් සහ පවුලේ අරමුදල | 143-6001-0000-3306-9 | 69,906 | 69,906 |
| ඩැනියෙල් සැන්ඩර්ස් | 20001-17-85290 | 30,000 | 30,000 |
| ඩැනියෙල් සැන්ඩර්ස් | 20001-17-31696 | 30,000 | 30,000 |
| ඩැනියෙල් සැන්ඩර්ස් | 20001-16-06930 | 65,000 | 65,000 |
| ඩැනියෙල් සැන්ඩර්ස් | 20001-05-39449 | 90,000 | 90,000 |
| ඩැනියෙල් සැන්ඩර්ස් | 20001-05-41842 | 29,514 | 29,514 |
| ඩැනියෙල් සැන්ඩර්ස් | 143-6001-0000-2693-2 | 30,000 | 30,000 |
| ස්වර්ණා ජයලත් | 20001-16-06956 | 15,000 | 15,000 |
| රාසනායගම් - මහජන බැංකුව MSW | 143-6001-0000-2701-2 | 30,000 | 30,000 |
| ආර් ජයසිංහ (ඉමන්දි රොනාලි) | 143-6001-0000-2153-3 | 25,000 | 25,000 |
| TG & MG - මහජන බැංකු MSW | 143-6001-0000-2352-4 | 50,000 | 50,000 |
| මහජන බැංකුව | 143600100005704-2 | 25,000,000 | 25,000,000 |
| මහජන බැංකුව | 143600100005711-3 | 2,750,000 | 2,750,000 |
| මහජන බැංකුව | 143600100005707-9 | 2,000,000 | 2,000,000 |
| මහජන බැංකුව | 143600100005708-8 | 2,000,000 | 2,000,000 |
| මහජන බැංකුව | 143600100005709-7 | 2,000,000 | 2,000,000 |
| මහජන බැංකුව | 143600100005701-4 | 2,000,000 | 2,000,000 |
| මහජන බැංකුව | 143600100005705-1 | 2,000,000 | 2,000,000 |
| මහජන බැංකුව | 14360010000570-60 | 2,000,000 | 2,000,000 |
| මහජන බැංකුව | 143600100005538-4 | 10,000,000 | 10,000,000 |
| මහජන බැංකුව | 143600100005537-5 | 10,000,000 | 10,000,000 |
| මහජන බැංකුව | 143600100005536-6 | 10,000,000 | 10,000,000 |
| මහජන බැංකුව | 143600100005535-7 | 10,000,000 | 10,000,000 |
| මහජන බැංකුව | 143600100005534-8 | 10,000,000 | 10,000,000 |
| මහජන බැංකුව | 3246001000147020 | 25,000,000 | |
| මහජන බැංකුව | 3246001000158120 | 10,000,000 | |
| | | **125,214,420** | **90,214,420** |

**උපලේඛනය - 06 කාර්ය මණ්ඩල ප්‍රතිලාභ**

| | 2023 | 2022 |
|---|---|---|
| **ජංගම නොවන** | | |
| කේ එම් වයි කරුණාරත්න මහතා මයා | - | 1,408,380 |
| එම් ටී ආර් එස් අත්තනායක මිය | 1,503,385 | 1,445,563 |
| වී ගෞරි වාසුදේවන් මිය | 1,353,563 | 1,299,420 |
| ඊ ඒ එම් එස් පී විජේසේකර මිය | 833,000 | 768,000 |
| වරදරජා ජෙයරූබන් මයා | 833,000 | 784,000 |
| යූ.එල්.එම්. අෂ්කර් මයා | 615,615 | 571,643 |
| එස්. හරිහරතමෝදරන් මයා | 752,000 | 705,000 |
| සී.එම්. මුණසිංහආරච්චි මිය | 339,125 | 310,658 |
| වි. බලාමති මිය | 339,125 | 310,658 |
| එච්.එම්.ඩී. සුබෝදිනී හේරත් මෙනවිය | 310,658 | 276,140 |
| වයි එච් එස් සිල්වා මිය | - | 231,613 |
| එල් සී අයි ජයසේන | 339,125 | 241,238 |
| එල් කේ පුෂ්පකාන්ති | 954,135 | 901,128 |
| එම් එස් එම් අස්මියාස් | 954,135 | 901,128 |
| කේ පි ඩී නිරෝෂිකා | 752,000 | 705,000 |
| කේ එස් වැදිසිංහ | 484,000 | 440,000 |
| පී සී හෙට්ටිආරච්චි | 345,175 | 310,658 |
| ඒ එම් කේ එල් අධිකාරි | 345,175 | 310,658 |
| ඒ එච් උබෙයිදුල්ලා මයා | 339,125 | 310,658 |
| බී කේ එස් කරුණාරත්න  මයා | 345,175 | 310,658 |
| ජේ එච් අයි ප්‍රසාද්  මයා | 345,175 | 310,658 |
| ටී තර්ෂන්  මයා | 345,175 | 310,658 |
| ජේ කේ පී යූ කීර්ති මයා | 470,000 | 423,000 |
| සන්ධ්‍යා සිරිකුමාර මිය | 345,175 | 310,658 |
| බී ඒ එන් පී විජේබණ්ඩාර  මිය | 746,075 | 712,163 |
| ඒ එම් මානමුදලි මිය | 324,000 | 291,600 |
| මධුෂානි සිල්වා මිය | 194,063 | 172,500 |
| කේ සී කේ තාබෘ | 194,063 | 172,500 |
| ඒ එච් ඉන්දික සංජීව මයා | 194,063 | 172,500 |
| වසන්ත කුමාර මයා | 611,379 | 577,414 |
| එස් ඒ එස් එන් ප්‍රේමරත්න මයා | 105,563 | 84,450 |
| සී එච් ඩී හෙට්ටිආරච්චි මිය | 542,800 | 519,188 |
| ධනුෂ්කා උස්හෙට්ටි මිය | 464,850 | 426,113 |
| ඩී කේ අයි විජේරත්න මයා | 335,610 | 307,643 |
| එච් සී බී සුමනපාල මයා | - | 201,200 |
| වයි එම් නිම්සාද් මයා | 297,788 | 264,700 |
| පී එල් මුණසිංහ මයා | 192,015 | 170,680 |
| එච් කේ එෆ් රමීසා මිය | 251,500 | 226,350 |
| ඩී එම් පුෂ්පා දිසානායක මිය | 605,130 | 578,820 |
| දීපිකා දමයන්ති මිය | 478,610 | 453,420 |
| අයි එම් එස් නීලකාන්ති මිය | 571,205 | 546,370 |
| සීතා රත්නායක මිය | 563,040 | 538,560 |
| එච් එම් යූ හේරත් මයා | 377,280 | 353,700 |
| නයනා ලියනගේ මිය | 538,560 | 514,080 |
| චම්පිකා ගුණසේකර මිය | 408,240 | 385,560 |
| වයි මඩවලගේ මිය | 348,480 | 326,700 |
| නදීකා පී දිල්වා මිය | 317,700 | 296,520 |
| ෆාතිමා ෆරීහා මිය | 319,500 | 298,200 |
| විමල් රංජිත් සිල්වා මයා | - | 334,560 |
| ආර් දර්ශනී මිය | 216,480 | 216,480 |
| එස් එරංග මෙන්ඩිස් මයා | 290,325 | 270,970 |
| ඒ.ඩී. ජයසිංහ මිය | 200,300 | 193,550 |
| ආර්. එස් කේ. පින්තු මිය | 200,300 | 193,550 |
| ඩබ්ලිව්.ඒ.එස්.වී.ලක්මාලි මිය | 200,300 | 193,550 |
| ඉසුරු නිමේෂ් සිල්වා මයා | 200,300 | 193,550 |
| එන්.එච්.හේවාපතිරණ මිය | - | 168,795 |
| එච්. සීලවතී මෙනවිය | 475,320 | 455,515 |
| ටී එම් කමලාවතී මිය | 168,795 | 150,040 |
| යූ එන් සමිත සිල්වා මයා | 168,795 | 150,040 |
| යූ ටී භානු මිය | 168,795 | 150,040 |
| එච්.කේ.ඩී.ඩබ්ලිව්. ධර්මශ්‍රී මයා | 206,305 | 187,550 |

| උපලේඛනය - 06 කාර්ය මණ්ඩල ප්‍රතිලාභ අඛණ්ඩව....) | 2023 | 2022 |
|---|---|---|
| අයි.එම්.ඩී.ආර්. මදුවන්ති මිය | 168,795 | 150,040 |
| ඩී එම් ආර් වරිතා මෙනවිය | 150,040 | 131,285 |
| ආර් පී ඩී අරුණෝදි මිය | 148,840 | 130,235 |
| ටී ඩී ආරියදාස මයා | 150,040 | 131,285 |
| එස් එම් ටී බී සමරකෝන් මයා | 150,040 | 131,285 |
| පී විදානපතිරණ මයා | 387,410 | 367,020 |
| උපාලි රූපසිංහ මයා | 340,765 | 320,720 |
| ජේ ඒ සමන්ත මයා | 298,425 | 278,530 |
| රුවන් චන්දන මයා | 224,160 | 205,480 |
| ඒ ඩී ඉන්දික පුෂ්පකුමාර මයා | 183,950 | 165,555 |
| වයි ජී එස් කේ ජයලත් මයා | 158,265 | 140,680 |
| ජෙසුලි ජිෆ්රි මයා | 539,500 | 518,750 |
| ඩී එම් පී දිසානායක මිය | 510,500 | 490,080 |
| අමිල සම්පත් මයා | 448,910 | 428,505 |
| එස් රන් ජී ප්‍රේමරත්න මයා | 283,125 | 264,250 |
| දිලංක ගුණවර්ධන මයා | 193,435 | 175,850 |
| එස් එම් අසංක ජයරංග මයා | 194,150 | 176,500 |
| වයි එම් බී ගයාන් මයා | 175,250 | 157,725 |
| ඩී ඩී එම් ජයසිංහ මයා | 153,225 | 136,200 |
| ඒ එස් කේ අලංකාර මයා | 153,225 | 136,200 |
| ඒ වී නිෂාලි සිල්වා මිය | 155,475 | 138,200 |
| රුවිනි මධුෂානි මිය | 153,225 | 136,200 |
| ඩබ්ලිව් ජී ඉන්දික ප්‍රසාද් | 147,640 | 129,185 |
| කේ පී සී නිමාලිකා මිය | 153,225 | 136,200 |
| බී ජී එම් සමරසිංහ මිය | 195,225 | 165,438 |
| එම් ඩී ජේ එස් ගමගේ මිය | 112,530 | 93,775 |
| එම් එච් එල් සී දයාරත්න මිය | 112,530 | 93,775 |
| වී කජේන්ද්‍ර මයා | 109,830 | 91,525 |
| එම් එල් එම් සත්සර මයා | 112,530 | 93,775 |
| එච් පි එස් ජයතිලක මිය | 109,830 | 91,525 |
| ජී කරුණාකරන් මයා | 125,340 | 104,450 |
| ජෙ ඩේවිඩ් මයා | 101,400 | 84,500 |
| චන්දි ලතිකා මිය | 72,620 | 54,465 |
| ටී රාජ්කමල් මයා | 66,600 | 49,950 |
| යූ එල් කේ එස් පියසේන මයා | 69,800 | 52,350 |
| ලක්මාල් ධනුෂ්ක මයා | 69,800 | 52,350 |
| ඊ එච් එල් මධුවන්ති | 63,245 | 31,623 |
| | **31,663,462** | **31,581,746** |

| **උපලේඛනය- 07 ගෙවූ පාඨමාලා ගාස්තු ආදායම** | **2023** | **2022** |
|---|---|---|
| කෙටි කාලීන පුහුණු වැඩසටහන් | - | 2,264,000 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 21/23 | - | 8,285,500 |
| ආසියානු අරමුදල් වැඩසටහන | - | 901,281 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව සීදූව 20/22 - (සි) | - | 41,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව සීදූව 20/22 - (ඉ) | - | 9,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව කුරුණෑගල 21/23 - (සි) | - | 1,402,500 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව රත්න 2021/23 (සි) | - | 331,500 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව (තලාව) 2021/2023 | - | 1,402,500 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව හැටන් 2020-2022-T | - | 382,500 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව යාපනය 2123 T | - | 1,173,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව ත්‍රිකුණාමලය 20/22 | - | 1,096,500 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව 2021/23 අම්පාර T | - | 1,453,500 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2022/2024 | - | 9,053,500 |
| ප්‍රජා විශෝධනය පිළිබඳ ඩිප්ලෝමාව ( කුරුණෑ/රත්න/මාතර) | - | 510,000 |
| උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2021/23 කොළඹ (සි) | - | 2,048,500 |
| යුනිසෙෆ් වැඩසටහන් | 1,065,031 | 1,414,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව හැටන්/නුවර/මඩක 22/23 | 1,310,000 | 1,820,400 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව රත්න/ අම්පාර 21/23 | 395,500 | 1,235,500 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව 2022/24 සීදූව (සි/ඉ/දෙ) | 1,943,000 | 2,501,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව වව්නියා 22/24 - (දෙ) | 1,130,000 | 1,506,000 |
| සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව 2022/24 සීදූව | 325,000 | 650,000 |
| සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව 2023/25 සීදූව | 410,000 | - |
| කෙටි කාලීන පුහුණු වැඩසටහන් - සමෘද්ධි | 491,500 | - |
| සමෘද්ධි නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 524,625 | - |
| ජපන් භාෂා වැඩසටහන | 5,688,022 | - |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2023/2025 (සි/ඉ/දෙ) | 9,009,075 | - |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව JAF 23/24 (දෙ) | 1,847,975 | - |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව 2023/25 See (සි/ඉ/දෙ) | 3,420,000 | - |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව කිළිනොච්චි 2023/24 | 1,305,000 | - |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව (තලාව) 2023/25 | 1,410,000 | - |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව (පුත්තලම) 19/21 - (දෙ) | 140,000 | - |
| ආසියානු අරමුදල් වැඩසටහන 2023 | 2,100,000 | - |
| | **32,514,729** | **39,481,681** |

| **උපලේඛනය - 08 ස්ථාවර තැන්පතු පොලිය** | | **2023** | **2022** |
|---|---|---|---|
| එම්.එම්.එම්. නසීර් සහ පවුලේ අරමුදල | 143-6001-0000-3306-9 | 16,764 | 2,808 |
| ඩැනියෙල් සැන්ඩර්ස් අරමුදල | | 38,278 | 11,758 |
| ස්වර්ණා ජයලත් අරමුදල | 20001-16-06956 | 3,015 | 408 |
| මහජන බැංකුව | | 18,053,736 | 6,751,950 |
| රාසනායගම් - මහජන බැංකුව MSW | 143-6001-0000-2701-2 | 6,313 | 3,354 |
| ආර් ජයසිංහ (ඉමන්දි රොනාලි) | 143-6001-0000-2153-3 | 3,972 | 1,171 |
| TG & MG - මහජන බැංකු MSW | 143-6001-0000-2352-4 | 9,142 | 1,933 |
| | | **18,131,220** | **6,773,382** |

| **උපලේඛනය - 09 ලැබිය යුතු පාඨමාලා ගාස්තු** | **2023** | **2022** |
|---|---|---|
| උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2019/21 කොළඹ (සි) | | |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව 19/21 කිළිනොච්චි - (දෙ) | - | 310,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව නුවර 2019/21 (දෙ) | - | 262,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව 19/21 තලාව (සි) | - | 283,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව 2020/22 සීදූව (ඉ) | - | 192,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව 2020/22 සීදූව (දෙ) | - | 61,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව පුත්තලම 19/21 - (දෙ) | - | 200,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව 2020/22 කිළිනොච්චි | - | 211,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව අම්පාර 19/21 - (සි) | - | 271,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව 19/21 යාපනය - (දෙ) | - | 322,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව - රත්නපුර 2020/22 | - | 249,000 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 20/22 (සි/ඉ/දෙ) | 5,343,000 | 6,013,000 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2021/2023 (සි/ඉ/දෙ) | 6,296,200 | 8,678,500 |
| උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 21/23 කොළඹ (සි) | 150,000 | 579,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව අම්පාර 21/23 (දෙ) | 194,000 | 502,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව ත්‍රිකුණාමලය 21/23 | 124,000 | 124,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව යාපනය 21/23 T | 51,000 | 300,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව තලාව 2021/23 | - | 196,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව නුවර 21/23 T | 22,100 | 530,100 |
| | **12,180,300** | **19,283,600** |

# 04. විගණකාධිපති වාර්තාව

## 4.1 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. එල්එස්ඩබ්/බී/එන්අයිඑස්ඩී/ එෆ්එස්/2023 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2024 ජූනි 25 දින |

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික සමාජ සංවර්ධන ආයතනය

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.යූ.එස්.ඒ. විජේකෝන්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : 1. ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 4.2. අවසාන ගිණුම් පිළිබඳ විගණන මතය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : එල්එස්ඩබ්/බී/එන්අයිඑස්ඩී/එෆ්එස්/2023

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2024 ජුනි 25 දින

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික සමාජ සංවර්ධන ආයතනය

**ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ රෙගුලාසි ගෙනෙතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනයකළ මතය

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවට සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සටහන් අංක 3.4 ප්‍රකාරව මුදල් අයකර පවත්වාගෙන යනු ලබන අදාළ පාඨමාලාවන් සම්පූර්ණ කර ඇති ප්‍රතිශතය පදනම් කරගෙන ආදායම් හා වියදම් හඳුනාගෙන ගිණුම්ගත කරන බව සඳහන් කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඒ අනුව රු. 32,514,729 ක් වූ පාඨමාලා ගාස්තු ආදායම් හා රු. 34,387,050 ක් වූ පාඨමාලා වියදම් පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි 27 වන පරිච්ඡේදය ප්‍රකාරව සාධාරණ ලෙස ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 128 ඡේදය ප්‍රකාරව ආයතනයේ අරමුදලේ ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුහුණතෙහි දක්වා හරස් යොමුව සටහනක් මඟින් දැක්විය යුතු වුවත් අරමුදලට සිදුකල ශුද්ධ ගැලපීම පමණක් ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශයට ඇතුලත් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ගුණාත්ව සහතිකවීම් වැඩසටහන වෙනුවෙන් මිලදී ගෙන තිබූ රු. 607,600 ක් වූ ලැප්ටොප් පරිගණකය, දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම් ගත කල යුතු වුවත්

වර්ෂයේ තත්ත්ව සහතිකවීමේ ( Quality Assurance ) වියදම් ලෙස ගිණුම්ගත කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා වත්කම් වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) පාඨමාලා ආදායමෙන් සියයට 20 ක් ජාතික සමාජ සංවර්ධන අරමුදලට බැර කිරීමට තීරණය කර තිබුණද එම ප්‍රමාණයට වඩා වැඩියෙන් හා අඩුවෙන් මුදල් බැර කර තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතරම වර්ෂය තුල ආරම්භ කර තිබූ ආදායම රු. 22,752,082 ක් වූ පාඨමාලා 12 කින් කිසිදු මුදලක් අරමුදලට බැරකර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලට බැරකර තිබූ රු. 8,012,324 ක මුදල නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

(ඉ) වාර්ෂිකව සමාජ වැඩ උපාධි පාඨමාලාව සඳහා මහපොළ ශිෂ්‍යත්වලාභීන් වෙනුවෙන් රජයෙන් ලැබිය යුතු මුදල හා වාර්ෂිකව සිසුන්ට ගෙවිය යුතු මුදල උපචිත පදනම මත ගිණුම් ගත නොවීම හේතුවෙන් 2022 වර්ෂයේදි ශිෂ්‍යත්වලාභීන් ට ගෙවිය යුතු රු.1,203,800 ක් හා 2023 වර්ෂයේ ගෙවිය යුතු රු. 384,850 ක මුදලක් අදාල වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) වාහන හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා සඳහා දරන ලද රු. 2,387,043 ක පුනරාවර්තන වියදම, ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් ස්ථාවර වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) වටිනාකම රු.15,795,278 ක් වූ පරිගණක හා උපාංග යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම් ගත කර තිබුණි

(ඌ) ස්ථාවර වත්කම් ලේඛනය හා උපලේඛනයේ සඳහන් 2014 හා 2016 යන වර්ෂයන්හි සිට පැවත එන රු. 7,243,629 ක් වූ පුස්තකාල පොත් රු 13,181,463 ක් වූ කාර්යාල උපකරණ හා රු 9,652,434 ක්වූ යන්ත්‍රෝපකරණ ඇතුළු රු 30,077,526 ක් වූ ස්ථාවර වත්කම් වල ආරම්භක ශේෂ තහවුරු කර ගැනීම සඳහා එම වත්කම් ගත් දිනය,පිරිවැය, වත්කමේ ස්වභාවය ඇතුළු කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවිය.

(එ) පුස්තකාල පොත් සම්බන්ධයෙන් 2023 වර්ෂය සඳහා සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. 2022 වර්ෂයේ සිදුකල සමීක්ෂණය හා 2023 වර්ෂය තුල සිදුකල විශේෂ පරීක්ෂණය අනුව පරිත්‍යාග වශයෙන් ලද පොත් 3345 ක් පිලිබඳ වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් 2023දෙසැම්බර් 31 දිනට රු. 9,628,520 ක් වූ පුස්තකාල පොත් ශේෂය සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඒ) ආයතනය විසින් වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා පිළිවෙලින් සියයට 10 හා සියයට 12.5 බැගින්ද, එම වත්කම් අලුත්වැඩියා සඳහා දරන ලද පුනරුත්ථාපන වියදම් සඳහා සියයට 25 බැගින්ද එකම වත්කම වෙනුවෙන් ක්ෂය අනුපාත 2 ක් භාවිතා කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

3

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යෑමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවිය හැකි බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයනා ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

5

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ආ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුවම අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

අවශ්‍යතාවය නිසි පරිදි හඳුනානොගෙන රු. 280,125 කට 2021 ඔක්තෝබර් 05 දින මිලදී ගෙන තිබූ ආලින්ද පුටු (Lobby chairs) 24 ක් වසර 2 ක් ගත වී තිබුණද නිෂ්ක්‍රියව ගබඩාවේ රඳවා තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 30 දින මිලට ගෙන තිබූ රු. 39,296,925 ක ගෘහ භාණ්ඩ තොගයක් වාර්තාවේ දින දක්වා භාවිතයට නොගෙන පැවතුණි. අක්‍රිය වීම හේතුවෙන් අළුත්වැඩියා කිරීමට ගබඩාවට භාර දී තිබූ පරිගණක 12 ක් වසරකටත් වඩා වැඩි කාලයක් අලුත්වැඩියා නොකොට ගබඩාවේ නිශ්ක්‍රියව රඳවා තිබුණි.

2.3. වෙනත් කරුණු

(අ) 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවා ඇති ජාතික සමාජ සංවර්ධන අරමුදල සඳහා ආයතනය විසින් මුදල් අය කර පවත්වා ගෙන යනු ලබන පාඨමාලාවලින් සියයට 20 ක් අරමුදලට වාර්ෂිකව එකතුවේ. වර්ෂයේ ගිණුම්ගත කර ඇති පාඨමාලා ආදායමෙන් සියයට 25 ක් වූ රු. 8,012,324 ක මුදල 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 11 කොටසේ 7 වන පරිච්ඡේදයේ 7.1.4 ඡේදය ප්‍රකාරව ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා යෙදවිය හැකිව තිබුණත් සමාලෝචිත වර්ෂයේ රු.3,452,202 ක් පමණක් ඩිජිටල්කරණ වැඩසටහනකට සහ තත්ත්ව සහතික වීමේ වැඩසටහන වෙනුවෙන් වැය කර තිබුණි. 2022 හා 2021 යන වර්ෂයන් වල පිළිවෙලින් පාඨමාලා ආදායමෙන් රු. 3,767,251 ක් හා රු. 465,529 ක් අරමුදලට මාරු කර තිබුණද ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු වෙනුවෙන් මුදල් වැය කර නොතිබුණි. අරමුදල වර්ධනය කොට ඒ තුළින් ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය කරගැනීමට චක්‍රලේඛ මගින් අවකාශ සලසා තිබියදී ඒ අනුව කටයුතු නොකිරීමෙන් 2023 දෙසැම්බර් 31දිනට අරමුදල් ශේෂය රු.13,622,201 ක් දක්වා වර්ධනය වී ඌණ උපයෝජිතව පැවතුණි.

(ආ) ආයතනයට අයත් තක්සේරු වටිනාකම රු. 10,600,000 ක් වූ කැළණිය සිසු නේවාසිකාගාරය 2020 ජූනි මාසයේ සිට භාවිත කරමින් තිබූ භාණ්ඩ ද සමඟ වාර්තාවේ දිනය දක්වා නිශ්ක්‍රියව පැවතුණි. මෙම නේවාසිකාගාරය භාවිතයෙන් තොරව පැවති කාලය වසර 03 ක් ඉක්මවා තිබුණු අතර එය නිසි නඩත්තු කිරීමක් සිදු කර නොමැති බැවින් නේවාසිකාගාරය විනාශ වෙමින් පැවතුණද

කළමනාකරණය විසින් මෙම දේපල පිළිබඳව කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේ ආරම්භ කරන ලද නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම 2024 මැයි මස වන විට ඉදි කිරීම් ආරම්භ කර වසර 6 ක් ගත වී තිබුණද, එම කටයුතු සාර්ථකව නිම කර ගැනීමට කළමනාකරණයට නොහැකිවී තිබුණි. මේ හේතුවෙන් පාඨමාලා පැවැත්වීමේ ඉඩ පහසුකම් සීමා වීම මත පාඨමාලා සඳහා බඳවා ගන්නා සිසුන් ප්‍රමාණයද සීමා වී තිබුණි.

(ඈ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇති 2015 වර්ෂයට පෙර සිට පැවත එන රු. 2,000,000 ක ණය අරමුදල පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. මෙම ණය අරමුදලින් නිලධාරීන් සඳහා ණය ලබාදීම සිදුකරන බව සඳහන් වුවත් 2023 දෙසැම්බර් 31 දක්වා මෙම අරමුදල් ශේෂය නොවෙනස්ව පැවතුණි. නමුත් වාර්ෂික අයවැයෙන් ඇස්තමේන්තු කර නොමැතිව නිලධාරීන්ට පාපැදි ණය සහ උත්සව අත්තිකාරම් ලබාදී තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු. 13,093,816 ක්ව පැවතුණි. මෙම සේවක ණය දෙවීම සඳහා අනුමැතිය නිරීක්ෂණය නොවීය.

(ඉ) 2023 අගෝස්තු 25 දිනැති අධ්‍යයන කටයුතු මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කරන ලද අංක 63/07/2003 දරන පත්‍රිකාව අනුව පශ්චාත් උපාධි පාඨමාලාවේ විෂය මාලාව සංශෝධනය කිරීමට අධ්‍යයන කටයුතු මණ්ඩලය නිර්දේශ ලබා දී තිබුණද 2013 වර්ෂයේ සිට එම සංශෝධනයන් සිදුකර නොතිබුණි. ඒ අනුව 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතනය පනතේ 10 (5)(3)(අ) වගන්තිය ප්‍රකාරව අධ්‍යයන කටයුතු මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද ඉහත නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. සමාජ සංවර්ධන ආයතනය විසින් ආරම්භයේ සිට විගණිත දින දක්වා එක් උපාධි පාඨමාලාවක් පමණක් පවත්වාගෙන යනු ලබන අතර අනෙකුත් සමගාමී උපාධි පාඨමාලා පවත්වනු ලබන ආයතන සමඟ සැසඳීමේදී රැකියා වෙළඳපොළ අනුව නව පාඨමාලා ආරම්භ කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

## 4.3 විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්ගේ නිරීක්ෂණයන්

**මූල්‍ය ප්‍රකාශන විගණනය - 2023 වර්ෂය**

**ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවේ අන්තර්ගත නිරීක්ෂණ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්ගේ අදහස් ඇතුළත් වාර්තාව.**

........................................................................................................................................................................

**1.2 තත්ත්වා ගණනය කළ මතය සඳහා පදනම**

(අ) පාඨමාලාව ආරම්භ කර පලමු සෙමෙස්ටරයේ විභාගය පැවැත්වීමට පෙර සියලුම ශිෂ්‍යයන් විසින් ගෙවීම් සිදුකළ යුතු අතර ඒ අනුව උපදේශන පාඨමාලා සඳහා වාරික දෙකකින් ගෙවීම් කිරීමට ඉඩ සලසා දී ඇත. මෙහිදී පාඨමාලා ආරම්භයේදී පළමු වාරිකය පළමු සෙමෙස්ටර විභාගයට මුහුණ දිමට පෙර දෙවන වාරිකයත් ඔවුන් ගෙවනු ලබයි. එසේම දෙවන වාරිකය ගෙවීමට නොහැකි වූ සිසුන් පාඨමාලාව හැරගිය සිසුන් ලෙස සලකන අතර අයවැය ඇස්තමේන්තුව නැවත සකස් කිරීමක් සිදුකරනු ලබයි. ඒ අනුව ආදායම හඳුනා ගැනීමේදී මාස 18 ක පාඨමාලාවක් නම් අදාල වර්ෂයට අදාල ආදායම පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කරනු ලබයි. අපහට වැඩිපුර ආදායම් ලැබී ඇත්නම් කලින් ගෙවූ පාඨමාලා ආදායම (pre-paid course) ලෙස ගණුම් ගත කරනු ලබයි. 2019 සිට 2022 වර්ෂය දක්වා ශ්‍රී ලංකාව තුළ ඇති වූ කොරෝනා ව්‍යසනය හා ආර්ථික අර්බුදය, ඉන්ධන හිගය ආදී වූ ගැටලුකාරී තත්වයන් හේතුකොට ගෙන වැඩිකාලයක් ආයතනය වසා තැබීමටත් මාර්ග ගත ක්‍රමයට (Online) පාඨමාලා දේශන පවත්වාගෙන යාම නිසාත් පාඨමාලා වියදමට අදාළ වවුචර් පත් ගිණුම් අංශයට නොලැබීම හේතු කොට ගෙන 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වර්ෂයට අදාළ වියදම නිසි පරිදි වියදම් කිරීමට නොහැකි වීම හේතු කොට ගෙන 2023 වර්ෂයේ දී ද 2018 වර්ෂයේ සිට 2022 දක්වා වූ වර්ෂ වලට අදාළ වියදම් 2023 වර්ෂයේ දී වියදම් කිරීමට සිදු විය. එනම් 2018 වර්ෂයේ සිට 2022 දක්වා වූ පාඨමාලා ගාස්තු ආදායම නිසි පරිදි ගිණුම් ගත කර තිබූ නමුත් එම වර්ෂ වලට අදාළ වියදම අදාළ වවුචර් පත් ගිණුම් අංශයට නොලැබීම හේතු කොට ගෙන වියදම නිසි පරිදි ගිණුම් ගත කිරීමට නොහැකි විය. නමුත් 2023 වර්ෂයේ සිට අදාල ආදායම හා වියදම නිසි කාලයට ගිණුම් ගත කිරීම සිදු කරමින් පවතී. ඉදිරියේදී එසේ නොවීමට වගබලා ගනිමි.

(ආ) ආයතනයේ අරමුදලින් සිදු කළ ගැළපීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පහළින් සටහනක් මඟින් දක්වා ඇති අතර එහි විස්තරාත්මක වාර්තා විගණනය සඳහා ලබා දී ඇති අතර ඉදිරියේ දී වෙනමම සටහනක් මඟින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති අරමුදලට සිදු කල ගැළපීම් විස්තරාත්මකව ඉදිරිපත් කිරීමට ද කටයුතු කරමි.

(ඇ) මෙම ලැප් ටොප් පරිගණක දෙක මිල දී ගෙන ඇත්තේ 2023.12.29 වන දිනය. තත්ත්ව සහතිකවීමේ අය වැය වාර්තාවේ මේ සඳහා ප්‍රතිපාදන වෙන් කර පාලක සභාව මඟින් අනුමැතිය ලබා ගෙන ඇති බැවින් අදාළ වියදම තත්ත්ව සහතික වීමේ මධ්‍යස්ථානය ( Center of Quality Assurance) යටතේ දක්වා ඇත. 2024 වර්ෂයේ දී මෙය වත්කමක් ලෙස දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම් ගත කර 2024.01.01 දින සිට ක්ෂය කපා හැරීමට අදාළ පියවර ගනිමි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී අරමුදලට බැර කර ඇත්තේ රු. 8,012,324/- ක මුදලක් පමණි. ඉතිරි පාඨමාලා සඳහා අදාළ මුදල පාඨමාලා අය වැය ඇස්තමේන්තු අනුමත කිරීමෙන් පසුව පාඨමාලාවේ පළමු සෙමෙස්තර විභාගයට පෙර ජාතික සමාජ සංවර්ධන අරමුදල සඳහා වූ 20% න් 50% ක් පමණක් අරමුදල සඳහා ලබා දෙන අතර ඉතිරි 50% ලබා දෙනුයේ පළමු සෙමෙස්තර විභාගයෙන් අනතුරුව පාඨමාලා වලට අදාළ අය වැය ඇස්තමේන්තු සංශෝධනය කරීමෙන් අනතුරුව සකස් කරන ලද පාඨමාලා ඇස්තමේන්තු මඟිනි. ආයතනය මඟින් පවත්වා ගනු ලබන පාඨමාලා මෙහෙය වනු ලබන්නේ සමාජ සේවා විද්‍යාලයෙන් හා පුහුණු අංශයෙනි. එක් එක් පාඨමාලා වලට අදාල ආයතනික ගාස්තු වවුචර් පත් මෙම අංශ දෙක හරහා ගිණුම් අංශයට ලැබුණු පසු අරමුදලට එම මුදල් බැර කිරීම සිදු කරයි. ඒ අනුව වවුචර් පත් ලැබෙන පරිදි 2024 වර්ෂයේ දී නියමිත පරිදි වවුචර්පත් ලබා දෙන ලෙස අදාළ අංශ දැනුවත් කරමි.

(ඉ) සමාජ වැඩ උපාධි පාඨමාලාව සඳහා රජයෙන් ලැබී ඇති මහපොළ ශිෂ්‍යත්ව මුදල් පිළිවෙලින් 2022 වර්ෂයේ 1,203,800/- ක් හා 2023 වර්ෂයේ 384,850/- ක් වන අතර ඉන් 2022 වර්ෂයේ දී රු. 963,200/- ක් හා 2023 වර්ෂයේ දී රු. 356,900/- ක මුදලක් ශිෂ්‍යත්ව ලාභීන් අතර බෙදා දී ඇත. ඉතිරි මුදල උපචිත ලෙස ගිණුම් ගත කර නිවැරදි කිරීමට ඉදිරියේ දී කටයුතු කරමි. (ගෙවූ මුදල සටහන - 17 හි දක්වා ඇත) ඉතිරි මුදල මහපොළ භාර අරමුදලට යැවීමට කටයුතු කළ යුතුව ඇත.

(ඊ) ස්ථාවර වත්කම් අලුත්වැඩියාව සඳහා දීර්ඝ කාලීනව භාණ්ඩාගාරයෙන් ලබා දෙන පුනරුත්ථාපන ප්‍රතිපාද වලින් දරණ වියදම 2016 වර්ෂයේ සිට 2021 දක්වා ස්ථාවර වත්කම් සටහන මඟින් (Rehabilitation) පෙන්වා ඇත. (LKAS 16 අනුව) 2022 වර්ෂයේ දී ප්‍රාග්ධන වියදම් ලබා දී නොමැත.

(උ) පෙර වර්ෂ වලදී ද පරිගණක උපාංග ගිණුම්ගත කර ඇත්තේ යන්ත්‍රෝපකරණ හා උපාංග යටතේ වන අතර පරිගණක උපාංග සඳහා වෙනම ගිණුමක් පවත්වා ගෙන නොමැත. විගණනයෙන් දක්වා ඇති පරිදි 2024 වර්ෂයේ දී පරිගණක හා උපාංග සඳහා වෙනම ගිණුමක් පවත්වා ගැනීමට කටයුතු කරමි.

(ඌ) ස්ථාවර වත්කම් ලේඛණයේ 2016 වර්ෂය සඳහා දක්වා ඇති ආරම්භක ශේෂ ලබා ගෙන ඇත්තේ පෙර වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන මඟින් වන නමුත් ඊට පෙර ආයතනයේ ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර එම ආරම්භක ශේෂයන්ට අයත් ස්ථාවර වත්කම් පිළිබඳ වෙන් වෙන් වශයෙන් භාණ්ඩ හෝ වටිනාකම හඳුනා ගෙන නොතිබුණි. මේ පිළිබඳ පැහැදිලි විස්තරයක් නොමැති බව පෙර වර්ෂ වලදීද විගණන අංශ දැනුවත් කර ඇත. 2016.01.01 දිනට පැවති මුළු ශේෂය ආරම්භක ශේෂය වශයෙන් සැලකිල්ලට ගෙන එතැන් සිට ස්ථාවර වත්කම් ලේඛණය නිවැරදිව පවත්වා ගෙන ඇත.

(එ) 2022 වර්ෂයේදී සිදුකරන ලද පුස්තකාල සංගණනයේදි හඳුනාගන්නා ලද අඩුපාඩු නිවැරදි කිරීම පිණිස පුස්තකාල උපදේශන කමිටුවේ උපදෙස් මත පුස්තකාලයේ සියලු පොත් (පරිත්‍යාග පොත් 3345 ද ඇතුළුව) නැවත මුල සිට ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. 2023 වර්ෂය සඳහා පුස්තකාල සමීක්ෂණ කටයුතු හැකි ඉක්මණින් පවත්වා අවසන් කිරීමට සැලසුම් කර ඇත. 2023 පුස්තකාල සමීක්ෂණ කටයුතු වලින් අනතුරුව පොත් සම්බන්ධ නිවැරදි තක්සේරු කිරීමක් සිදුකර වාර්තාව ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි.

(ඒ) අප ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදී භාවිතා කරනු ලබන ගිණුම්කරණ ප්‍රමිත වලට අදාළව 3.2.4 යටතේ ක්ෂය ගණනය කිරීම් LKAS 16 අනුව සිදු කර ඇති අතර ඒ අනුව පුනරුත්තාපනය සඳහා 25%ක ප්‍රතිශතයක් ද අනෙකුත් ඒවා සඳහා විවිධ ප්‍රතිශතයන් යොදා ගැනීම දීර්ඝ කාලීනව යොදා ගෙන ඇත.

**2.2.4**

2021 වර්ෂයට ගොඩනැගිල්ල සඳහා භාණ්ඩ මිලදී ගැනීමට වෙන්කරන ලද මුදල් වලින් Wing A හා Wing B සඳහා ආලින්ද පුටු (Lobby Chairs) මිලදි ගන්නා ලදී. මින් යම් ප්‍රමාණයක් Wing B (දැනට පංතිකාමර පවත්වන අධ්‍යයන ගොඩනැගිල්ලේ භාවිතා කරමින් පවතී) Wing A පරිපාලන ගොඩනැගිල්ලේ අදාල ස්ථාන වල මෙම ආලින්ද පුටු (Lobby Chairs) වලින් වැඩි ප්‍රමාණයක් ස්ථාපිත කලයුතුව ඇත. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් මූලික එකගතාවය මත 2020/04/03 දිනට අවසන් කිරීමට නියමිතව තිබුණද රට තුල පැවති Covid 19 හේතුවෙන්, පැන නැගී ඇති අනෙකුත් මූලික ගැටලු ඉන්ධන හිගය , විදුලිය ඇනහිටීම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා ඉදිකිරීම් අමුද්‍රව්‍ය ලබාගැනීමේ ගැටලු හා ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල උච්ඡාවචනය වීම යානාදිය හේතුවෙන් නියමිත දිනයට අවසන් කිරීමට නොහැකි විය.

මේ හේතුවෙන් අවස්ථා ගණනාවකදී පාලක සභාවේ අනුමැතිය මත කාලය දීර්ඝ කිරීම් සිදුවිය. Wing A ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් වූ වහාම එය ප්‍රයෝජනයට ගැනීම සඳහා ඉතිරිය ගබඩාවේ සුරක්ෂිතව තැන්පත් කරන ලදි. වර්තමානයේදී විශේෂ අවස්තාවලදී මෙම පුටු අවශ්‍යතාවය මත පරිහරණය කර නැවත සුරක්ෂිතව තැබීම සිදුකරයි. මෙය එම ගොඩනැගිල්ලේ පරිහරණය කිරීම සඳහාම මිලදී ගත් බව ප්‍රකාශ කරමි.

එමෙන්ම 2023 වර්ෂය සඳහා වෙන්කරන ලද මුදලින් මිලදී ගත් ගෘහභාණ්ඩ ගොඩනැගිල්ලේ සිසුන්ගේ පන්තිකාමර වල අවශ්‍යතාවය සඳහාම මිලදී ගත් දේශනශාලා පුටු , විභාග සඳහා වන ශිෂ්‍ය පුටු, ශිෂ්‍ය විභාග ලිවිමේ මේස යනාදිය වන අතර අනෙකුත් භාණ්ඩ සිසුන්ගේ පිළිතුරු පත්‍ර, විෂය පැවරුම් සුරක්ෂිතව ගබඩා කිරීම සඳහා දේශකවරුන් වෙත ලබාදෙන ලද කැබිනට් (අල්මාරි) යනාදිය වේ. දේශකවරුන් වෙත මේ වන විටද ඉන්වෙන්ට්‍රි ලේඛනය හරහා කැබිනට් නිකුත් කර ඇති අතර එය ප්‍රයෝජනයට ගනී.

සිසුන් සඳහා මිලදී ගත් ගෘහ උපකරණ Wing A (පරිපාලන ගොඩනැගිල්ලේ) නිමවෙමින් පවතින ගොඩනැගිල්ලේ පවත්වන දේශන හා වැඩසටහන් සඳහා අවශ්‍යතාවය පරිදි නිකුත් කර නැවත ආරක්ෂිතව තැබිම සිදුකරයි. (ගොඩනැගිල්ලේ වැඩ නිමකර නොමැති බැවින් භාණ්ඩ වල ආරක්ෂාව වෙනුවෙන් මෙය සිදුකරයි) මෙයට හේතුව සිසුන්ගේ පන්ති කාමර 26 ක් පිහිටා ඇත්තේ Wing B ගොඩනැගිල්ලේ වන අතර ඉන් සිසුන්ගේ ස්ථිර පරිහරණය සඳහා යොදාගත හැකි වන්නේ පන්ති කාමර 10 ක් පමණි. ඉතිරි ඒවායේ කාර්ය මණ්ඩලය. ගබඩාව, පරිගණක ලැබ් හා පුස්තකාලය ස්ථාපිත කර පවතී. Wing A හි ඉදිකිරීම් ඉදිරියේදී අවසන් වූ වහාම පරිපාලන ගොඩනැගිල්ල වෙත කාර්ය මණ්ඩලය හා ඉහත සඳහන් සියලුම අංශ රැගෙනයාම සිදුකිරීමෙන් හිස්වන පන්ති කාමර 16 සඳහා එම ගෘහභාණ්ඩ ස්ථිරවම යොදවා භාවිතයට ගැනිමට හැකියාව ඇත. අලුත්වැඩියාව සඳහා ගබඩාවට භාර දී තිබූ පරිගණක 12 ක ප්‍රමාණය අලුත්වැඩියා කිරීම සඳහා මේ වන විට මිල ගණන් කැඳවා සුදුසු ආයතනයක් තෝරා ගෙන එම ආයතනය හරහා අලුත්වැඩියා කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

**2.3.** වෙනත් කරුණු

(අ) ආයතනයේ අරමුදලින් 2023.12.31 වන විට ඉතිරිව ඇති රුපියල් 13,622,201/- ක මුදලින් වියදම් දැරීම සඳහා 2024 ක්‍රියාකාරී සැලැස්ම මගින් තත්ත්වසහතිකකරණය, ඩිජිටල්කරණය හා ජාලගතකරණය සඳහා රුපියල් මිලියන 17.528 ක ප්‍රතිපාදන වෙන්කර ඇත. මෙම වියදම් ආයතන අරමුදලේ ඉතිරිව ඇති මුදලට අමතරව 2021 වර්ෂයේ දී පාලක සභා උපදෙස් මත පාඨමාලාවල අතිරික්ත ආදායමෙන් ස්ථාවර තැම්පතු ලෙස ආරම්භකර ඇති. මිලියන 25 ක මුදලින්ද වියදම් දැරීමට නියමිතය.

(ආ) 2020 වසරේ ආයතනය රාජගිරියේ සිට සීදුවට රැගෙන යාමත් සමග සිසුන් කැලණියේ නේවාසිකාගාරයෙන් ඉවත් වී සීදුව අවට පදිංචි විය. නේවාසිකාගාරයේ නඩත්තු කටයුතු සඳහා ද විශාල වියදමක් දැරීමට සිදුවන අතර 29/03/2023පාලක සභා පත්‍රිකාව මගින් උපදෙස් ලබාදුන් පරිදි කැලණිය විශ්ව විද්‍යාලයේ සිසුන් වෙත ලබාදීමට අදාලව එහි පාලන අංශය වෙත දැනුම් දුන් අතර විදේශීය සිසුන් සඳහා නේවාසිකවීම් වෙනුවෙන් ලබාගැනීමට ඇති හැකියාව සලකා බලන බව පාලන අංශයෙන් දැනුම් දි ඇත. නමුත් මේ පිළිබඳව විමසීම් සිදුකළද යහපත් ප්‍රතිචාර නොලැබුණි. 2024 අප්‍රේල් මස පැවති ආයතනයේ පාලක සභාව විසින් දැනුම් දෙන ලද්දේ නේවාසිකාගාරය වෙනත් ආයතනයකට බදු පදනම යටතේ ලබාදීමට කටයුතු කරන ලෙසයි. කැලණිය නේවාසිකාගාරයේ තිබූ භාණ්ඩ වලින් කොටසක් මේ වන විට ප්‍රධාන කාර්යාලයට රැගෙන විත් ඉන්වෙන්ට්‍රි ගතකර ප්‍රධාන කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා යොදාගෙන ඇත.

(ඇ) සීදුව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2017 නොවැම්බර් මස ආරම්භ කරන ලද අතර එහි ඉදිකිරීම් කටයුතු 2020/04/03 දිනයෙන් අවසන් කිරීමට නියමිතව තිබුණි. නමුත් 2020 මාර්තු මස ආරම්භ වූ කොවිඩ් 19 වසන්ගත තත්ත්වය හේතුවෙන් සීදුව ප්‍රදේශයේ නිරෝධායන ඇදිරි නීතිය දිගින් දිගටම පැවතීම හා වැඩබිමේ සේවකයින් දිගින් දිගටම නිරෝධායනයට ලක්වීම හේතුවෙන් එම වසර පුරාවට වැඩබිම විටින් විට වසා තබන ලදී. ඉන්පසු ඇති වූ ඉන්ධන හිගය, විදුලිය නොමැති වීම, ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ඉහලයාම වැනි තත්වයන් හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද විය. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල උච්ඡාවචනය හේතුවෙන් හානිපූර්ණය සඳහා වන වියදම් ගෙවීමට 2021/12/06 දිනැති අ.ම.ප. 21/2084/306/094 අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කටයුතු කරමින් පවතී. ඉදිකිරීම් බාරව සිටින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් මිල විචලනය සඳහා හානිපූර්ණ ගෙවීම් ලැබීමෙන් පසු මාස 4ක් තුලදී ඉදිකිරීම් අවසන් කිරීමට පොරොන්දු වී ඇත.

(ඈ) ආපදා ණය ගෙවීම සඳහා ආයතනය වෙත භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 2 ක මුදලක් 2005 වර්ෂයට පෙර ලබාදී ඇති අතර ආයතනයේ සේවක සංඛ්‍යාව වැඩිවීම නිසා ආපදා ණය මුදල වැඩිකිරීම සඳහා භාණ්ඩාගාරයෙන් විටින් විට ඉල්ලීම් සිදුකර ඇත. මේ සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා දී නොමැති අතර කාර්ය මණ්ඩලයේ දැඩි අවශ්‍යතාවය අනුව පාලක සභාවේ අනුමැතියට යටත්ව ආපදා ණය මුදල් ආයතනයේ අරමුදලින් ගෙවීමට කටයුතු කර ඇත.

(ඉ) මේ වන විට පශ්චාත් උපාධි පාඨමාලාවේ විෂය මාලාව සංශෝධනය කර ඇති අතර 2022/23 පශ්චාත් උපාධි කණ්ඩායම සඳහා මෙම නව විෂය මාලාව ඇතුළත් ශිෂ්‍ය අත් පොත ලබා දී ඇත. එමෙන්ම ආයතනයේ මේ වන විට නව උපාධි පාඨමාලා 4ක් ආරම්භ කිරීමට අදාළ විෂය නිර්දේශ සකස් කර ඒ සඳහා අධ්‍යයන කටයුතු මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇති අතර එය අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල (SCAQA) Standing Committee in Accreditation and Quality Assurance යටතේ අනුමැතියට යැවීමට කටයුතු කරමින් පවතී.

- වෘද්ධ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- උපදේශන මනෝ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය
- සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය
- මානව විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය

ආචාර්ය රවීන්ද්‍ර විතානාච්චි
**අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)**
ජාතික සමාජ සංවර්ධන ආයතනය

**National Institute of Social Development**
Liyanagemulla,
Seeduwa,
Sri Lanka

Tel : +94 112 882 506 / 07
Fax :+94 112 882 502
E-mail : info@nisd.ac.lk
web : www.nisd.ac.lk